**ශීර්ෂ 105 - ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය**

---

මෙම වාර්තාවේ 1 ඡේදයේ සිට 2 ඡේදය දක්වා අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවල ගිණුම් පිළිබඳ පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ සිට එක් එක් ශීර්ෂයට අදාල විගණන නිරීක්ෂණ දැක්වේ.

## 1 අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු

| ශීර්ෂ | දෙපාර්තමේන්තුව |
|---|---|
| 218 | සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව |
| 281 | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව |
| 305 | උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව |

### 1.1 විගණන විෂය පථය

ඉහත 1 ඡේදයේ සඳහන් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තු තුනෙහි 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව පහත සඳහන් දිනවල එම අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තුවල ප්‍රධාන ගණන්දීමේ නිලධාරීට හා ගණන්දීමේ නිලධාරීන් වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

| ශීර්ෂ | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | කළමනාකරණ විගණන වාර්තාව නිකුත් කළ දිනය |
|---|---|---|
| 105 | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 2015.09.25 |
| 218 | සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව | 2015.07.27 |
| 281 | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | 2015.08.14 |
| 305 | උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව | 2015.07.21 |

### 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම

විසර්ජන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

### 2.1 විසර්ජන ගිණුම්

#### (අ) මූළ ප්‍රතිපාදනය හා වියදම

අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු 03 ක් සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 107,885.80 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 107,667.06 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවල ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් රු.මිලියන 1.44 ක සිට රු.මිලියන 173.99 ක් දක්වා පරාසයක ප්‍රමාණයකින් පැවැතුණි**.** විස්තර පහත දැක්වේ.

| ශීර්ෂ | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 105 | 85,879.51 | 85,705.52 | 173.99 | 0.20 |
| 218 | 15,509.93 | 15,503.51 | 6.42 | 0.04 |
| 281 | 6,474.74 | 6,437.84 | 36.90 | 0.57 |
| 305 | 21.62 | 20.18 | 1.44 | 6.66 |
| එකතුව | 107,885.80 | 107,667.05 | 218.75 | 0.2 |

#### (ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ 04 ක් හා දෙපාර්තමේන්තුවක් විසින් එකතුව රු.මිලියන 489.65 ක් වූ ප්‍රතිපාදන ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබුණු අතර එම ප්‍රතිපාදනයෙන් රු. මිලියන 290.15 ක් උපයෝජනය කර තිබුණි. ඒ

අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු. මිලියන 199.50 ක් හෙවත්, ලබා දී තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 40.74 ක් ඉතිරි කර තිබුණි.

## 2.2 අත්තිකාරම් ගිණුම්

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තු 03 කට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 10501 | 170.00 | 169.17 | 90.00 | 109.57 | 600.00 | 369.54 |
| 21801 | 12.00 | 9.81 | 8.50 | 10.80 | 90.00 | 46.94 |
| 28101 | 210.00 | 190.04 | 140.00 | 140.86 | 800.00 | 388.62 |
| 30501 | 2.00 | 1.14 | 0.80 | 2.06 | 8.00 | 2.83 |

## 2.3 අග්‍රිම ගිණුම්

අමාත්‍යාංශයේ හා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2014 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂ පිළිවෙලින් රු. මිලියන 515.462 ක් හා රු.මිලියන 0.25 ක් වී තිබුණි.

## 2.4 පොදු තැන්පත් ගිණුම්

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු 03 ක 2014 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.මිලියන 4,248.166 ක් විය. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | තැන්පත් ගිණුම් අංකය | 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු.මිලියන |
| ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 6000/0000/00/0015/0019/000 | 379.35 |
| සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0099/000 | 3,454.49 |

| | | |
|---|---|---|
| ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0136/000 | 261.82 |
| | 6000/0000/00/0006/0051/000 | 151.69 |
| | 6000/0000/00/0002/0010/000 | 0.23 |
| | 6000/0000/00/0001/0010/000 | 0.01 |
| | 6000/0000/00/0013/0024/000 | 0.39 |
| උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0160/000 | 0.18 |
| | | ----------- |
| **එකතුව** | | **4,248.17** |
| | | ====== |

## 2.5 විගණන නිරීක්ෂණය

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවල විසර්ජන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවල සඳහන් නිරීක්ෂණවලට යටත්ව පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවල ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ සිට 6 ඡේදය දක්වා වූ ඡේදවල දක්වා ඇත.

## 3. ශීර්ෂ 105 – ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| (i) | චෙක්පත් හා මුදල් ඇනවුම් ලේඛනය | මුදල් රෙගුලාසි 451 | පවත්වා නොතිබුණි. |
| (ii) | රාජකාරී දුරකථන ලේඛනය | මුදල් රෙගුලාසි 845(1) | පවත්වා නොතිබුණි. |
| (iii) | ඇප තැබිය යුතු නිලධාරින් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) | පවත්වා නොතිබුණි. |
| (iv) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) | පවත්වා නොතිබුණි. |
| (v) | ඉන්ධන හා ලිහිසි තෙල් තොග පොත | මුදල් රෙගුලාසි 1647(ඇ) | පවත්වා නොතිබුණි. |
| (vi) | ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණ ඇගැයීම් කමිටුවල පැමිණීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය | පවත්වා නොතිබුණි. |
| (vii) | ප්‍රසම්පාදන කමිටුවල රැස්වීම් වාර්තා | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.3(අ) මාර්ගෝපදේශය | යාවත්කාලීන කර නොතිබුණි |
| (viii) | ලංසු කැඳවීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2.1 මාර්ගෝපදේශය | පවත්වා නොතිබුණි. |

3.2 **විගණන සාක්ෂි නොවීම**

**---------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 අංක 01 දරන දිවිනැගුම පනත ප්‍රකාරව සමෘද්ධි අධිකාරිය, දක්ෂිණ සංවර්ධන අධිකාරිය සහ උඩරට සංවර්ධන අධිකාරිය යන ආයතන තුන ඒකාබද්ධ කර අංක 1843/4 සහ 2014 ජනවාරි 03 දිනැති ගැසට් නිවේදනය මගින් 2014 ජනවාරි 03 දින සිට බලාත්මක වන පරිදි දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවා තිබුණි. එසේ වුවත්, 2013 වර්ෂයට අදාලව එම අධිකාරි තුන ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශනවලින් පසුව කිසිදු මූල්‍ය ප්‍රකාශනයක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතවලට අනුව 2014 වර්ෂය සඳහා එම එක් එක් ආයතනයේ වියදම පිළිවෙලින් රු.මිලියන 9,502, රු.මිලියන 134.03 හා රු.මිලියන 45.53 ක් වී තිබුණි.

(ආ) දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව ආරම්භ කිරීමේදී ඒකාබද්ධ කරන ලද අධිකාරි තුන සතුව පැවති වත්කම් පවරා ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව ස්ථාපනය කිරීමේදී සමෘද්ධි අධිකාරිය, දක්ෂිණ සංවර්ධන අධිකාරිය හා උඩරට සංවර්ධන අධිකාරිය යන ආයතනවල 2013 දෙසැම්බර් 31 දිනට පැවති වත්කම් පිළිවෙලින් රු.මිලියන 24,232.37, රු.මිලියන 283.83 ක් හා රු.මිලියන 65.89 ක් වශයෙන් එකතුව රු. මිලියන 24,582.09 ක් වි තිබුණි. 2014 ජනවාරි 01 දිනට නව දෙපාර්තමේන්තුව වෙත මෙම වත්කම් පවරා ගැනීම පිළිබඳ තොරතුරු විගණනය වෙත වාර්තා කර නොතිබුණු බැවින් එම වත්කම් වගකිවයුතු පාර්ශවයන් විසින් නියමිත පරිදි භාරගෙන ලේඛනගත කර තිබුණු බව විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය.

(ii) ඉහත ආයතනවල ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් හා 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/2 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වා නොතිබුණි.

(ඇ) දිවිනැගුම ජාතික වැඩසටහන VI වන අදියර යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොල්පැල බෙදා දීමේ වැඩසටහනට අදාලව පොල් සංවර්ධන මණ්ඩලයේ තොරතුරු අනුව රු. මිලියන 23.5 ක් වටිනා පොල් පැල 235,057 ක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 14 ක් වෙත ලබාදී තිබුණි. එම කාර්යාලය විසින් රු.මිලියන 14.17 ක් වටිනා පොල් පැල 141,671 ක් පමණක් ප්‍රතිලාභීන් වෙත බෙදාදී තිබුණු බව එම කාර්යාලවල ප්‍රගති වාර්තාවල ඇතුළත් වී තිබුණි. ඒ අනුව රු.මිලියන 9.33 ක් වටිනා පොල් පැල 93,386 ක් බෙදාහැරීම සම්බන්ධ කිසිදු තොරතුරු විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) 2014 සැප්තැම්බර් 20 දින පැවති ඌව පළාත් සභා ඡන්ද විමසීම යෙදී තිබුණු කාලවකවානුවල මොණරාගල දිස්ත්‍රික්කයේ නියඟයෙන් පීඩාවට පත් ජනතාවට සහන සැලසීම සඳහා අවසර ලබාදුන් බව සඳහන් 2014 සැප්තැම්බර් 12 දිනැති ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගයෙහි පිටපතක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඉ) මාතර දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ විමධ්‍යගත ප්‍රතිපාදන යටතේ දහම් පාසල් දරුවන් අතරේ බෙදා හැරීම සඳහා පිටු 80 අභ්‍යාස පොත් 102,083 ක් මිලදී ගැනීම සඳහා

රු.මිලියන 2.45 ක් වැයකර තිබුණි. විගණිත දිනය වූ 2015 අප්‍රේල් 30 දින වන විටත් අදාල පොත් බෙදාහැරීම පිළිබඳ කිසිදු තොරතුරක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඊ) කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පවත්වාගෙන යනු ලබන දහම් පාසල් සඳහා රු.499,428 ක් වටිනා අල්මාරි 10 ක් සහ ප්ලාස්ටික් පුටු 487 ක් මිලදී ගෙන තිබුණද, එම භාණ්ඩ දහම් පාසල්වලට නිසි පරිදි බෙදාදුන් බව හෝ දහම් පාසල් මගින් එම භාණ්ඩ භාරගත් බව සනාථ කරන තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(උ) කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අඩු ආදායම්ලාභීන් සහ ස්වයංරැකියාලාභීන් සඳහා බෙදාහැරීම සඳහා එකක් රු.20,550 ක් බැගින් වූ මහන මැෂින් 107 ක් මිලදී ගෙන තිබුණි. අදාල මහන මැෂින් මිලදී ගැනීමට අදාල ප්‍රසම්පාදන තීරණ, මැෂින් ලබාදුන් ප්‍රතිලාභීන් පිළිබඳ විස්තර සහ ප්‍රතිලාභීන් විසින් භාරගත් බවට කිසිදු තොරතුරක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**3.3 විගණන විමසුම්වලට පිළිතුරු දීම**

අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 13 කට 2015 අගෝස්තු 31 දින වන විටත් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුම්වලට අදාල ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු. මිලියන 2,735.41 ක් විය.

**3.4 විසර්ජන ගිණුම**

**3.4.1 අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 03 ක් සඳහා සළසා තිබුණු රු.68,000,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ආ) 2013 අංක 36 දරන විසර්ජන පනතේ 5(2) වගන්තියට පටහැනිව වැඩසටහන් අංක 01 යටතේ වූ රු.29,374,065 ක් වූ මූලධන ප්‍රතිපාදන ඉතිරිය වැඩසටහන 2 හි මූලධන වියදම් ප්‍රතිපාදනය සඳහා මාරුකර ගෙන තිබුණි.

(ඇ) මුදල් රෙගුලාසි 65(4)(v)(අ) හා (ආ) ට පටහැනිව විදේශාධාර මූලාකරණයන් යටතේ සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් ඉතිරිවූ රු.මිලියන 2,620.47 ක ප්‍රතිපාදන දේශීය අරමුදල් මූලාකරණයන් යටතේ ක්‍රියාත්මක වූ ගමනැගුම වැඩසටහන සඳහා සළසා තිබුණු ප්‍රතිපාදනවලට මාරුකර තිබුණි.

(ඈ) දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් අත්පත් කරගෙන තිබුණු රු.මිලියන 9,415 ක් වටිනා මූලධන වත්කම්, පුනරාවර්තන වියදම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

**3.4.2 වෙනත් අමාත්‍යාංශ හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට ලබා දුන් ප්‍රතිපාදන**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලබා ගත හැකි වූ තොරතුරුවලට අනුව විවිධ සංවර්ධන කාර්යයන් සඳහා අමාත්‍යාංශය විසින් එකතුව රු. මිලියන 23,507.61 ක් වූ ප්‍රතිපාදන දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාල

09 ක් සහ  අමාත්‍යාංශ 02 ක් වෙත ලබා දී තිබුණු අතර එම ප්‍රතිපාදනයෙන් රු. මිලියන 15,886.93 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.මිලියන 7,620.68 ක් හෙවත්, ලබා දී තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 32.4 ක් උපයෝජනය කර නොතිබුණි.

(ආ) සංවර්ධන ව්‍යාපෘතීන් සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට ලබා දෙන ලද ප්‍රතිපාදනවලින් 2014 දෙසැම්බර් 31 දින වන විට ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06  ක් විසින් රු.මිලියන 150.15 ක් වටිනා චෙක්පත්  7,209 ක් ලියා තිබුණු නමුත් එම චෙක්පත් ආදායකයන් වෙතට නිකුත් කර නොතිබුණි.

(ඇ) කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 කට අදාලව භාණ්ඩ  සහ උපකරණ මිලදී ගැනීම සම්බන්ධයෙන් එක් එක් ආයතනවලට නිකුත් කරන ලද එකතුව රු.මිලියන 3.59 ක් වූ චෙක්පත් 15 ක් 2015 මාර්තු 31 දින වන විටත් උපලබ්ධි වී නොතිබුණි.

(ඈ) කුරුණෑගල දිස්ත්‍රික්කයේ මහව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් භාණ්ඩ සහ උපකරණ මිලදී ගැනීම සඳහා රු.62,409 ක් වටිනා චෙක්පත් තුනක් ලියා තිබුණත් භාණ්ඩ ලැබී නොතිබීම හේතුවෙන් 2015 මාර්තු 31 දින වන විටත්  එම චෙක්පත් නිකුත් නොකර අත රඳවා ගෙන තිබුණි.

(ඉ) මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුනක් විසින් මුදල් රෙගුලාසි 237(ආ) ට පටහැනිව රු.1,479,949 ක් වටිනා චෙක්පත් 09 ක් 2015 පෙබරවාරි මාසය   අවසන් වන විටද අත රඳවාගෙන තිබුණි.

(ඊ) තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් වාණිජ කුකුළුපාලන ගොවිපලවල් ඇති කිරීම සඳහා කිකිළි පැටවුන් 43,579 ක් 2014 දෙසැම්බර් 31 දින මිලදී ගෙන තිබුණි. එම කිකිළි පැටවුන් වෙනුවෙන් මිලදීගත යුතු ප්‍රමිත වර්ධක ආහාර ප්‍රමාණය කි.ග්‍රෑම් 141,937 ක් වුවත්, එම ප්‍රමාණය  ඉක්මවා ආහාර කි.ග්‍රෑම් 21,484 ක් මිලදී ගැනීම නිසා 2015 ඔක්තෝබර් 16 දින වන විට එකතුව රු.1,697,236 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(උ) මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සංවර්ධන ව්‍යාපෘතීන්  වෙනුවෙන් ගෙවීම සඳහා 2014 දෙසැම්බර් 31 දින ලියන ලද රු.මිලියන 7.97 ක් වටිනා චෙක්පත් 36 ක් 2015  මාර්තු 31 දින වන විටත් අදාල පුද්ගලයන් වෙත ලබා නොදී අත රඳවාගෙන තිබුණි.

(ඌ) බදුල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 ක් විසින් ජීවනෝපාය සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිලාභින් 647 වෙනුවෙන් 2014 දෙසැම්බර් 31 දින ලියන ලද රු.මිලියන 7.15 ක් වටිනා චෙක්පත් 647 ක් 2015 ජුලි 06 දින වන විටත් ප්‍රතිලාභින්  වෙත නිකුත් කර නොතිබුණි.

(එ) අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 ක් විසින් ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිලාභීන් 6499 දෙනෙකු සඳහා ඔවුන්ගේ නමින් ලියන ලද රු.129,904,974 ක් වටිනා චෙක්පත් 6,499 ක් විධිමත් පරිදි ප්‍රතිලාභීන් හඳුනා

නොගැනීම, අපේක්ෂිත භාණ්ඩ ලබා නොගැනීම, ප්‍රතිලාභී දායකත්වය ලබා නොදීම වැනි හේතු නිසා 2015 ඔක්තෝබර් 22 දින වන විටද ප්‍රතිලාභීන්ට ලබා නොදී ප්‍රාදේශීය ලේකම්වරුන් භාරයේ තිබුණි.

**3.5 අග්‍රිම ගිණුම්**

**--------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් 2014 දෙසැම්බර් මාසයේදී රු.මිලියන 1,309.65 ක අග්‍රිම ලබාදී තිබුණි. එසේ වුවද, අමාත්‍යාංශයේ අවශ්‍යතාවයන් ඉක්මවා භාණ්ඩාගාරයෙන් අග්‍රිම ලබාගෙන තිබුණු බැවින් 2014 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුමේ රු.515,462,199 ක ශේෂයක් පැවතුණි.

(ආ) අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ග්‍රාමීය පාලම් ව්‍යාපෘතිය සහ ගැටුම්වලින් හානියට පත් ප්‍රදේශවල හදිසි සංවර්ධන ව්‍යාපෘතිය සඳහා 2014 වර්ෂයට අදාලව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ රාජ්‍ය ණය කළමනාකරණ අංශය විසින් පිළිවෙලින් රු.14,622,086 ක් සහ රු.24,334,805 ක් වැයකර තිබුණි. 2014 වර්ෂයේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂයන්හි ප්‍රතිපාදන ඉතිරියන් නොමැතිවීම නිසා 2014 වර්ෂයේදී එම වියදම් ගිණුම් ගත කර නොතිබුණි. එසේ වුවත් විසර්ජන ගිණුමේ ඩී.ජී.එස්.ඒ. 6(i) ආකෘතියේ මූලධන වියදමේ මුළු ශුද්ධ ප්‍රතිපාදන හා සත්‍ය වියදම අතර විචලතා සඳහා හේතු පැහැදිලි කිරීම යටතේ, ග්‍රාමීය පාලම් ව්‍යාපෘතියේ රු.4,698,885 ක ඉතිරිවීම් සඳහා ඇස්තමේන්තු ප්‍රතිපාදන ලෙස සඳහන් කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ග්‍රාමීය පාලම් ව්‍යාපෘතියේ ප්‍රතිපාදනයෙන් රු.119,947,000 ක් සහ ගැටුම්වලින් හානියට පත් ප්‍රදේශවල හදිසි සංවර්ධන ව්‍යාපෘතියේ ප්‍රතිපාදනයෙන් රු.380,046,930 ක් වීරමොං ක්‍රියාපටිපාටිය යොදාගෙන වෙනත් වැය විෂයයන්වලට ප්‍රතිපාදන මාරුකර තිබුණි.

(ඇ) මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව කාර්යය නිම කළ වහාම ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිමය නිරවුල් කළ යුතු වුවත්, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් අවස්ථා 69 කදී දෙන ලද රු.5,419,262 ක් වූ අත්තිකාරම් දින 7 සිට දින 52 ක කාල පරාසයක ප්‍රමාදයකින් පසුව පියවා තිබුණි.

(ඈ) මුදල් රෙගුලාසි 371 ට පටහැනිව දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් අවස්ථා 11 කදී නිලධාරීන් 08 දෙනෙකු වෙත රු.20,000 ක් ඉක්මවූ එකතුව රු.10,421,402 ක තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.

**3.6 පොදු තැන්පත් ගිණුම**

**----------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ 2 ක් ඉක්මවූ රු.16,409,817 ක්වූ තැන්පතු 51 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව සතුව 2014 දෙසැම්බර් 31 දිනට පැවති රු.180,592,977 ක් වූ පොදු තැන්පත් ශේෂ පිළිබඳව අමාත්‍යාංශය වෙත වාර්තා කර නොතිබුණු බැවින් එම පොදු තැන්පත් ශේෂ පිළිබඳව ගිණුම මගින් අනාවරණය කර නොතිබුණි.

(ඇ) ගෙවීමට ඉදිරිපත් නොකරන ලද එකතුව රු.302,880 ක් වටිනා චෙක්පත් 14 ක් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**3.7 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

**-----------------------------------------------------------------------**

විෂය අංක 10501 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.4,730,988 ක් වූ අතර, එම ශේෂ වර්ෂ 01 සිට වර්ෂ 15 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණත් එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත්වී තිබුණි.

(ආ) අමාත්‍යාංශය විසින් ණය ගෙවීමේදී පිළිපැදිය යුතු විධිවිධාන අනුගමනය නොකර රු.4,518,140 ක් ණය ගෙවා තිබුණි.

(ඇ) 2014 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයෙන් පිටතට ස්ථාන මාරු වීම් ලබා ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ශේෂය රු.1,540,706 ක් ලෙස සැසඳුම් ප්‍රකාශයේ සඳහන් කර තිබුණු අතර, එම ණයගැති ශේෂයෙන් රු.915,551 ක් වසර 15 ක පමණ කාලයක සිට පැවත එමින් තිබුණි.

(ඈ) අමාත්‍යාංශය විසින් 2014 දෙසැම්බර් 31 දිනට වැරදි හර කිරීම් වශයෙන් රු.21,000 ක්ද, වැරදි බැර කිරීම් වශයෙන් රු.323,683 ක් ද ගිණුමේ පෙන්නුම් කර තිබූ අතර එම වටිනාකම් නිරවුල් කර නොතිබුණි. මෙම වැරදි බැර කිරීම් වලින් රු.135,449 ක් හෙවත් සියයට 42 ක් 2014 වර්ෂයට පෙර සිට පැවත එන ශේෂයයන් විය.

(ඉ) 2007 වර්ෂයේ අමාත්‍ය මණ්ඩල සංශෝධන අනුව පවරා ගන්නා ලද ණය ශේෂ අතුරින් නිලධාරීන් 37 දෙනෙකුට අදාල එකතුව රු.1,198,829 ක රු.10,000 ට වැඩි ණය ශේෂයන් මුදල් රෙගුලාසි 109 ට ප්‍රකාරව පොත් වලින් අත්හැර දැමීමට රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් අනුමැතිය ඉල්ලා තිබුණි. නමුත් "තොරතුරු සොයා ගැනීමට නොහැකි වීම මතම මෙම ණය ශේෂයන් කපා හැරීමට සාධාරණයක් කළ නොහැකි අතර, එවැනි නිර්දේශයක් මත අනුමැතියක් ලබා දීමට නොහැකි" බව රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් දන්වා තිබුණි.

(ඊ) 2001 වර්ෂයේදී විදේශ නිවාඩු ලබා නැවත සේවයට වාර්තා නොකරන ලද නිලධාරීන් දෙදෙනෙකුගෙන් අය විය යුතු රු.1,076,581 ක් වූ ආපදා සහ දේපල ණය ශේෂයක් සැසඳුම් ප්‍රකාශයේ දක්වා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) එක් නිලධාරියෙකුගෙන් අයවීමට තිබුණු රු.542,280 ක් වූ දේපල ණය මුදලින් මිලදී ගත් දේපලවලට අදාල ඔප්පුව රජය නමින් පවරා ගැනීමට ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 11.9 වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව ණය අනුමත කළ බලධාරියා අපොහොසත් වී තිබුණි. 2014 දෙසැම්බර් 31 දින වන විටත් එම ඉඩම වෙනුවෙන් ඇටෝනි බලපත්‍රය ලියාපදිංචි කර ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේම, රු.64,274 ක් වූ ආපදා ණය ශේෂයක් හා එම ණය මුදලට අදාල රු.35,769 ක පොලී මුදල ද 2014 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ii) මෙම නිලධාරියා විදේශගත වී තනතුර අතහැර යාම හේතුවෙන් ඉහතින් සඳහන් කරන ලද ණය මුදලට අමතරව 2001 සැප්තැම්බර් සිට 2002 අගෝස්තු 31 දින දක්වා ගෙවා තිබුණු දළ වැටුප්, අනිවාර්ය සේවා කාලය සේවය නොකිරීම නිසා ගෙවිය යුතු දණ්ඩන මුදල් සහ විදේශ පුහුණුව සඳහා රජය මගින් දරන ලද වියදම වශයෙන් එකතුව රු.2,432,838 ක් ද අයවීමට තිබුණි.

(iii) අනෙක් නිලධාරියාගේ දේපල ණය ගොනුව අස්ථානගත වී ඇති බැවින් රු.345,794 ක් වූ දේපල ණය මුදල අයකර ගැනීමට නොහැකි වී තිබුණි. නිලධාරියා විසින් ණය මුදල් නොගෙවීම නිසා මෙම ණය මුදල අනුමත කර නිදහස් කර තිබුණු බලධාරීන්ට විරුද්ධව විනයානුකූලව කටයුතු කළ යුතු බවට ආයතන අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් උපදෙස් ලබාදී තිබුණද, එම උපදෙස් පරිදි එම කාලපරිච්ඡේදයේදීම කටයුතු කර ණය මුදල අයකර නොගෙන මෙම නිලධාරිනියගේ නම අසාධු නාම ලේඛනයට ඇතුළත් කිරීමට කටයුතු කර තිබුණි. එසේම, රු.124,233 ක් වූ ආපදා ණය ශේෂයක් හා ඊට අදාල පොලී මුදල ද 2014 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

## 3.8 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

### 3.8.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්ම 2014 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 3.8.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2014 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

## 3.9 වත්කම් කළමනාකරණය

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

### (අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත වර්ග කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

(i) අමාත්‍යාංශයේ ප්‍රතිපාදන උපයෝජනය කර පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය විසින් රු.44,347,822 ක් වටිනා ගැල්වනයිස් බට 40,056 ක් පළාත් පාලන ආයතන 77 කට බෙදා දී තිබූ අතර එම පළාත් පාලන ආයතන විසින් ලබා දී ඇති ලිඛිත සාක්ෂි අනුව එම ආයතන විසින් එවැනි ඉල්ලීමක් සිදුකර නොතිබුණු අතර අදාල බට එම ආයතනවල නිෂ්ක්‍රීයව ගොඩ ගසා තිබුණි.

(ii) කුරුණෑගල දිස්ත්‍රික්කයේ ජීවනෝපාය සංවර්ධන වැඩ සටහන යටතේ මිලදී ගෙන බෙදා දීමට තිබූ රු.27,930,032 ක් වටිනා උපකරණ 1,151 ක් බෙදා නොහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාල 14 ක ගබඩා කර තිබුණි.

(iii) මාතර ඉසදින් නගරයේ ක්‍රීඩා සමාජයකට පැරබොලික් මාදිලියේ ජංගම උත්සව ශාලාවක් සහ ජංගම වේදිකාවක් ලබාදිම වෙනුවෙන් උත්සව භාණ්ඩ අලෙවි කරන ආයතනයකට රු.1,658,000 ක් 2014 දෙසැම්බර් 16 දින ගෙවා තිබුණි. 2015 ඔක්තෝබර් 19 දින සිදුකරන ලද ස්ථානිය පරීක්ෂාවේදී අදාල භාණ්ඩ ක්‍රීඩා සමාජයට ලැබී නොතිබුණි.

(iv) මොණරාගල දිස්ත්‍රික් ක්‍රමසම්පාදන ලේකම් කාර්යාලයට අදාලව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 9 ක් විසින් 2012, 2013 හා 2014 වර්ෂවල අමාත්‍යාංශ ප්‍රතිපාදනවලින් විවිධ වැඩසටහන් යටතේ බෙදා හැරීමට මිලදී ගෙන තිබූ රු.37,712,454 ක් වටිනා ද්‍රව්‍ය හා උපකරණ ඒකක 113,278 ක් ප්‍රතිලාභීන්ට බෙදා නොහැර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ගබඩා කර තිබුණි.

(v) විවිධ වැඩසටහන් යටතේ 2014 වර්ෂයේදී මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මිලදිගත් රු.24,641,041 ක් වටිනා භාණ්ඩ අදාල පුද්ගලයන්ට හෝ ආයතනවලට බෙදාදීමකින් තොරව 2015 මාර්තු 31 දින වන විටත් ගබඩාවේ රඳවාගෙන තිබුණි.

(vi) නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් විමධ්‍යගත ප්‍රතිපාදන සහ මහජන නියෝජිතයන්ගේ විශේෂ ව්‍යාපෘති යටතේ මිලදී ගෙන තිබුණු රු.938,478 ක් වටිනා භාණ්ඩ අයිතම 04 ක් 2015 ඔක්තෝබර් 20 දින වන විටත් අදාල ප්‍රතිලාභීන් අතරේ බෙදා දී නොතිබුණි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

---------------------------------------

2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2014 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2015 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, අමාත්‍යාංශය විසින් 2015 මැයි 31 දින වන විටත් එම වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. අවසාන වශයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2013 වර්ෂය වෙනුවෙන් පවත්වා තිබුණි.

**(ඇ) පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම**

-----------------------------------------------------------

අමාත්‍යාංශය විසින් විධිමත් පරිදි වත්කම් පවරා නොගෙන එම වත්කම්වල සිදු කර තිබුණු ඉදිකිරීම්/අළුත්වැඩියාවන් සම්බන්ධව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මාතර දිස්ත්‍රික්කයේ මුලටියන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.6,232,089 ක් වැයකර පුද්ගලික ඉඩම්වල බහුකාර්ය ගොඩනැගිලි 04 ක් ඉදිකර තිබූ අතර අදාල ඉඩම් රජයට පවරාගෙන නොතිබුණි.

(ii) දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කලෝගහඇල සතිපොල සංවර්ධනය කිරීම රු.1,000,000 ක ප්‍රතිපාදන මත 2014 ඔක්තෝබර් 21 දින වන විට ඉටුකර තිබුණද මෙම ඉඩම ප්‍රාදේශීය සභාවට පවරාගෙන නොතිබුණු අතර වර්තමානයේ සතිපොල භාවිතයට ගැනීමක් ද සිදුව නොතිබුණි.

(iii) දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වෙලන්ගොල්ල ක්‍රීඩා පිටිය රු.1,550,000 ක වැයකර ඉදිකර තිබුණද, එම ඉඩමේ අයිතිය සභාවට පවරාගෙන නොතිබුණු අතර ක්‍රීඩාපිටිය ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(iv) මහනුවර දිස්ත්‍රික්කයේ පන්විල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 2014 ගමනැගුම සංවර්ධන වැඩසටහන යටතේ රු.929,839 ක් වැය කර ඉදිකරන ලද පන්විල උඩුකුඹුර ග්‍රාමයේ ප්‍රජා ශාලාව සඳහා යොදාගත් ඉඩම නීත්‍යානුකූල ලෙස පවරාගෙන නොතිබුණි.

(v) මහනුවර දිස්ත්‍රික්කයේ පන්විල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රු.2,000,000 ඇස්තමේන්තුගත පිරිවැයක් සහිත ඉදිකරන ලද මඩුල්කැලේ ක්‍රීඩා පිටිය සඳහා යොදාගනු ලැබූ මාඋස්සාව වතුයායේ අක්කර 1½ ක් වූ භූමි ප්‍රමාණය රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය යටතේ වූ ශ්‍රී ලංකා වැවිලි සංස්ථාව සතු වුවත්, එය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ඈ) බේරුම් නොකළ බැරකම්**

---------------------------

අමාත්‍යාංශයේ 2014 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ වර්ෂයකට අඩු බැරකම් රු.7,623,729,432 ක් වූ අතර, ඒ පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| **විස්තරය** | **බැරකම්** |
|---|---|
| | **රු.** |
| විසර්ජන ගිණුම අනුව හෙළිදරව් කළ බැරකම් | 6,283,207,693 |
| විසර්ජන ගිණුම මගින් හෙළිදරව් නොකළ - අමාත්‍යාංශය | 2,209,393 |
| විසර්ජන ගිණුම මගින් හෙළිදරව් නොකළ - ලෝක ආහාර වැඩ සටහන | 289,115 |
| දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව | 1,338,023,231 |
| **එකතුව** | **7,623,729,432** |

**3.10 අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **වටිනාකම** | **අනුකූල නොවීම** |
|---|---|---|---|
| | | **රු.** | |
| (අ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | |
| | XIV පරිච්ඡේදයේ 4.1, 4.4.3, 4.5 සහ 4.6 වගන්ති | 34,500 | මොණරාගල දිස්ත්‍රිකයේ සහනාධාර බෙදාදීමේ කාර්යයන්හි නිරත වූ රජයේ නිලධාරීන් 10 දෙනෙකුට (තවත් නිලධාරීන් 07 දෙනෙකුට ගෙවූ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි) ගෙවිය යුතු සංයුක්ත දීමනාව වෙනුවට අමාත්‍යාංශ ලේකම්වරයාගේ නියෝගය මත දිනකට රු.1,500 බැගින් දීමනා ගෙවා තිබුණි. |
| (ආ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| | (i) මුදල් රෙගුලාසි 104(4) | 7,729,023 | ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යවරයෙකු විසින් භාවිතා කළ ජීප් රථය හදිසි අනතුරකට පත්වීම සම්බන්ධයෙන් වන පූර්ණ වාර්තාව 2014 දෙසැම්බර් 31 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ii) මුදල් රෙගුලාසි 137 | 48,565,000 | දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් අවස්ථා 5 කදී රු.මිලියන 48.57 කට අදාලව ප්‍රසම්පාදන කටයුතුවලදී උචිත පරිදි කටයුතු කර නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 138(4) | 1,078,385 | අමාත්‍යාංශයේ වාහන ලේඛනයේ ඇතුළත් නොවූ වාහන 23 ක් රක්ෂණය කිරීම සඳහා රු.1,078,385 ක් වැයකර තිබුණි. |
| (iv) මුදල් රෙගුලාසි 632 හා 633 | 54,120,000 | රජයේ දෙපාර්තමේන්තුවල මුද්‍රණ කටයුතු රජයේ මුද්‍රණාලය මගින් හෝ රජයේ මුද්‍රණාලයාධිපති විමසා අදාල අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අධිකාරිය මත පෞද්ගලික මුද්‍රණාල මගින් මුද්‍රණය කරවා ගැනීමට කටයුතු කළ යුතු වුවත්, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් අවස්ථා 6 කදී අදාල රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (v) මුදල් රෙගුලාසි 715(2)(3) | 894,600 | 2014 දැයට කිරුළ ප්‍රගතිය පිළිබඳ වාර්තා කිරීමට පොත් 150 ක් මුද්‍රණය කිරීමේදී අදාල ක්‍රියාමාර්ගය අනුගමනය කර නොතිබුණි. |

(ඇ) **ජනාධිපති ලේකම් කාර්යාලයේ චක්‍රලේඛ**

**---------------------------------**

| | | |
|---|---|---|
| (i) 2006 පෙබරවාරි 21 දිනැති අංක සීඑස්/ඒ/2/3/4 දරන චක්‍රලේඛයේ 4.2 ඡේදය | - | 2014 ජුනි 07 දින සිට 11 දින දක්වා ඕස්ට්‍රේලියාවේ පැවති ජලජීවී සම්මේලනයට සහභාගී වූ නියෝජ්‍ය අමාත්‍යවරයෙකු විසින් තම වාර්තා 2014 දෙසැම්බර් 31 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) 5.1 ඡේදය | - | ඕස්ට්‍රේලියාවේ පැවැති සමුළුවකට සහභාගී වූ නියෝජ්‍ය අමාත්‍යවරයෙකු විසින් විදේශ සංචාරය සඳහා ලබා ගත් දීමනා වියදම් වූ ආකාරය පිළිබඳව වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. |
| (iii) 2010 මැයි 14 දිනැති අංක සීඒ.1/17/1 දරන ජනාධිපති ලේකම්වරයාගේ ලිපියේ 3.1 ඡේදය | - | (i) නියෝජ්‍ය අමාත්‍යවරයෙකු විසින් චක්‍රලේඛ විධිවිධානලට පටහැනිව වාහන 04 ක් භාවිතා කර තිබුණි. |
| | 93,000 | (ii) නියෝජ්‍ය අමාත්‍යවරයෙකුට ඩීසල් රථයක් ලබාදිය යුතුව තිබුණත් ඉන්ධන දීමනාව පෙට්රල් වාහනයකට අදාල කරමින් ගණනය කර ගෙවා තිබුණි. |

**(ඇ) කළමනාකරණ සේවා චක්‍රලේඛ**

**------------------------**

| | | |
|---|---|---|
| (i) 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන චක්‍රලේඛයේ - 5.1(6) ඡේදය | 54,484 | ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහනේ කළමනාකරණ ඒකකයේ නිලධාරීන් විසින් අවස්ථා 09 කදී ක්ෂේත්‍ර පරීක්ෂාවන් සඳහා සංයුක්ත දීමනාව ලබා නොගෙන ඒ වෙනුවට ආහාරපාන සහ නවාතැන් වියදම් ලෙස ව්‍යාපෘති අරමුදලින් වැය කර තිබුණි. |
| - II ඡේදය | 240,164 | පැමිණීමේ දීමනා ගෙවා තිබියදීත් ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහනේ ජාතික නියමු කමිටු රැස්වීම් සඳහා සහභාගීවන කමිටු සාමාජිකයන්ට ආහාරපාන සැපයීම වෙනුවෙන් රු.240,164 ක් වැය කර තිබුණි. |
| (ii) 3.1(c) ඡේදය | 3,132,075 | ව්‍යාපෘති තුනකට පමණක් අදාලව සිදුකරන ලද පරීක්ෂාවේදී රාජකාරී ආවරණය කිරීමේ පදනම මත රාජකාරී කරන නිලධාරීන් විසින් එක් වරක් පමණක් ලබා ගැනීමට හිමිකම් පවතින විශේෂ දීමනාව අවස්ථා දෙකකදී ලබාගෙන ඇති අතර 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා මෙලෙස ලබාගෙන තිබුණු දීමනාව රු.3,132,075 ක් වී තිබුණි. |
| (ඉ) 2014 නොවැම්බර් 22 දිනැති අංක පීආර්ඊ/2015/43 දරන මැතිවරණ කොමසාරිස්වරයාගේ චක්‍රලේඛය හා එම අංක දරන 2014 දෙසැම්බර් 02 දිනැති චක්‍රලේඛය | 3,086,000,000 | අවස්ථා 8 කදී ජනාධිපතිවරණ අපේක්ෂකයකුගේ ප්‍රවර්ධනයට හේතුවිය හැකි කාර්යයන් සඳහා වන විවිධ භාණ්ඩ වර්ග බෙදාහැරීම, සහනාධාර ණය ආධාර ලබාදිම හා එවැනි වැඩසටහන් ක්‍රියාත්මක කර තිබුණි. |
| (ඊ) 2014 නොවැම්බර් 07 දිනැති අංක එම්ඊඩී/ආර්ඩී/ඩීඊවී/2014 දරන අමාත්‍යාංශ ලේකම්වරයාගේ ලිපිය | | ඉහළ ආදායම්ලාභී පවුල්, ස්ථිර රක්ෂාවක් තිබෙන පවුල් සහ අවිවාහක පුද්ගලයන් වෙත වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ජීවනෝපාය සංවර්ධන වැඩසටහන යටතේ ආධාර ගෙවා තිබුණි. |

**3.11 විදේශාධාර ව්‍යාපෘති**

සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය විසින් විදේශ මූල්‍යාණය යටතේ ව්‍යාපෘති 21 ක් ක්‍රියාත්මක කර තිබුණි. වාර්ෂික ඇස්තමේන්තු, මුදල් රෙගුලාසි 66 මාරුකිරීම් සහ ණය හා ව්‍යාපෘති ගිවිසුම් අනුව වර්ෂයේ මුළු ශුද්ධ ප්‍රතිපාදනවල එකතුව රු.15,837,780,288 ක් වී තිබූ අතර එම ව්‍යාපෘති වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.15,710,300,321 ක් උපයෝජනය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) විගණනයට භාජනය නොවූ විදේශ ව්‍යාපෘති**

ණය ගිවිසුම අනුව ප්‍රජා සංවර්ධන හා ජීවන මාර්ග වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (දෙවන) විගණකාධිපතිවරයාගෙන් බැහැර වෙනත් විගණන සමාගමක් විසින් විගණනය කර තිබුණි.

**(ආ) මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කිරීම**

අමාත්‍යාංශය විසින් 2015 මාර්තු 31 දින වන විට ගැටුම්වලින් හානියට පත් ප්‍රදේශ හදිසි සංවර්ධන ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත්, එම මූල්‍ය ප්‍රකාශන 2015 අගෝස්තු 31 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**3.12 දේශීය මූල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම්, ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම් හා ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

**(අ) ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම**

අමාත්‍යාංශය විසින් පහත සඳහන් ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණි.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තු පිරිවැය | ආරම්භ කළ යුතු වූ දිනය | ආරම්භ නොකිරීමට හේතු කෙටියෙන් |
|---|---|---|---|
| | රු. | | |
| පුත්තලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලත් ව්‍යාපෘති 09 ක්. | 3,000,000 | 2014 වර්ෂය | අධික වර්ෂාව නිසා මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට යෝජිත ප්‍රදේශය ගංවතුර තර්ජනයට මුහුණ දීම සහ අමුද්‍රව්‍ය සොයා ගැනීමට අපහසු වීම. |
| අම්පාර දිස්ත්‍රික්කයේ උහන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 2014 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබූ ව්‍යාපෘති 05 ක් | 950,000 | 2014 වර්ෂය | ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම, ප්‍රතිලාභීන්ගේ එකඟතාවයක් නොවීම, ඇස්තමේන්තු සකස් නොකිරීම සහ ස්ථානයක් තෝරා ගැනීමේ ගැටළු |
| නාය යෑමට ලක්වූවන්ට ලබාදුන් ඉඩම්වලට ජලපහසුකම් ලබාදීම වෙනුවෙන් ගම නැගුම වැඩසටහන යටතේ මාතලේ දිස්ත්‍රික්කයේ රත්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලබාදුන් ප්‍රතිපාදන | 2,000,000 | 2014.05.27 | ඉඩම්වලට මාර්ග පහසුකම් ලබාදීමෙන් අනතුරුව ජලපහසුකම් ලබාදීමට සැලසුම් කර තිබූ නමුත් මාර්ග පහසුකම් ලබාදීමේ ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් නිම නොකිරීම. |

| | | | |
|---|---|---|---|
| ගමනැගුම, පළාත් නැගුම හා ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන යටතේ මාතලේ දිස්ත්‍රික්කයේ පල්ලෙපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ව්‍යාපෘති යෝජනා 06 ක් | 2,200,000 | 2014 වර්ෂය | අයහපත් කාලගුණය හා තාක්ෂණික කරුණු. |
| මහනුවර දිස්ත්‍රික්කයේ ගඟඉහළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කර්මාන්ත 91 ක් | 18,575,000 | 2014 වර්ෂය | ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම, ප්‍රතිපාදන ප්‍රමාදවී ලැබීම, මාර්ග අබලන් වීම නිසා ප්‍රවාහනයට අපහසු වීම, බෑවුම් සහිත ප්‍රදේශවල පිහිටීම, ද්‍රව්‍ය ගෙන යාමේ අපහසුව, යෝජනාව ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් කාලයක් නොමැති වීම, අනුමත කොන්ත්‍රාත් සමිති ඉදිරිපත් නොවීම, වර්ෂාව, ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමේ අපහසුතා, මිලදී ගැනීම් වලදී සිදුවූ අපහසුතා |
| කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ව්‍යාපෘති 10 ක් ක්‍රියාත්මක කිරීම | 7,189,602 | 2014 වර්ෂය | මූලික ඇස්තමේන්තු සකස් කර නොතිබුණි. |
| මහනුවර දිස්ත්‍රික්කයේ කුණ්ඩසාල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ව්‍යාපාති 17 ක් | 4,700,000 | 2014 වර්ෂය | ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම, අනුමැතිය ලැබීමට ප්‍රමාද වීම, දේශපාලන අධිකාරිය විසින් ව්‍යාපෘති යෝජනා වරින්වර සංශෝධනය කිරීම, කෙටි කාලයක් තුළ ව්‍යාපෘති විශාල සංඛ්‍යාවක් කිරීමට සිදුවීම සහ අධික වර්ෂාව. |
| මහනුවර දිස්ත්‍රික්කයේ කුණ්ඩසාල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ව්‍යාපාති 33 ක ඉදිකිරීම් | 16,150,000 | 2014 වර්ෂය | ඉදිකිරීම් ද්‍රව්‍ය හිඟකම, දේශපාලන අධිකාරිය විසින් ව්‍යාපෘති යෝජනා වරින් වර සංශෝධනය කිරීම හා නිලධාරීන්ගේ කාර්ය බහුලත්වය. |
| මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සංවර්ධන ව්‍යාපාති 13 ක් | 9,050,000 | 2014 වර්ෂය | 2014 දෙසැම්බර් 31 දිනට වැඩ ආරම්භ කිරීමට හෝ මූලික කටයුතු ඉටු කිරීමට කටයුතු නොකර අත්හැර තිබුණි. |

| | | | |
|---|---|---|---|
| නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉදිකිරීමේ කර්මාන්ත 04 ක් | 4.,455,000 | 2014 වර්ෂය | ප්‍රමාණවත් මූලා පහසුකම් නොමැති සමිති වෙත කොන්ත්‍රාත් පිරිනැමීම. |

(

| | | | |
|---|---|---|---|
| නුවරඑළිය දිස්ත්‍රික්කයේ රිකිල්ලගස්කඩ ඔසු උයනේ කාණු පද්ධතිය හා පඩිපෙළ සැකසීම | 1,980,000 | 2014 වර්ෂය | දින 20 ක් තුළ ඉදිකර නිම කිරීමට ලබාදී තිබුණද විගණිත දින වූ 2015 අප්‍රේල් 02 දින දක්වා වැඩ ආරම්භ කර නොතිබුණි. |
| 2014 වර්ෂයේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ අනුමත කරන ලද ව්‍යාපෘති 206 ක් | 54,996,000 | 2014 වර්ෂය | වැඩ ආරම්භ කර නොතිබුණි. |

**ආ) ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම්**

**-------------------------------------------**

අමාත්‍යාංශය විසින් පහත සඳහන් ව්‍යාපෘති ආරම්භ කර තිබුණත් එම ව්‍යාපෘති නිම නොකර අතහැර තිබුණි.

| **ව්‍යාපෘතිය** | **ඇස්තමේන්තු පිරිවැය** | **ආරම්භ කළ දිනය** | **2014 දෙසැම්බර් 31 දින වන විට වියදම** | **අත්හැර දැමීමට හේතු** |
|---|---|---|---|---|
| ---------- | ----------------- | ------------ | -------------------- | --------------------- |
| | රු. | | රු. | |
| කළුතර දිස්ත්‍රික්කයේ මදුරාවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කෙසෙල්හේනාවපොදු ක්‍රීඩාපිටිය තැනීම හා රැඳවුම් බැම්ම බැඳීම. | 3,750,000 | 2014 වර්ෂය | 2,017,979 | - |
| හඟුරන්කෙත ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ මැටිබැඹිය බහුකාර්ය ගොඩනැගිල්ල ඉදි කිරීම | 990,000 | 2014 වර්ෂය | 224,486 | - |
| හඟුරන්කෙත ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ ලබුහේන්වල බහු කාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීම | 990,000 | 2014 වර්ෂය | 134,331 | - |
| හඟුරන්කෙත ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ කබරගල පාර කොන්ක්‍රීට් කිරීම | 1,485,000 | 2014 වර්ෂය | 825,557 | - |

| | | | | |
|---|---|---|---|---|
| කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නුගවෙල බහු කාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීම | 1,782,000 | 2014 වර්ෂය | - | ඇස්තමේන්තු අයිතම 34 න් 07 ක් පමණක් ඉටු කර ව්‍යාපෘතිය අතර මග නතර කර තිබුණි. |
| පුත්තලම දිස්ත්‍රික්කයේ ආණමඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ බම්මන්නේගම සරණංකර ප්‍රජා ශාලාව ඉදිකිරීම | 834,000 | 2014 වර්ෂය | 500,000 | - |
| මහනුවර දිස්ත්‍රික්කයේ පන්විල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංගම්මන අංක 53 ජල යෝජනා ක්‍රමය | 1,500,000 | 2014.09.11 | - | කොන්ත්‍රාත්කාර සමිතිය විසින් ගිවිසුම් අත්සන් කිරීම සඳහා නොපැමිණීම. |
| මුලටියන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගොම්බද්දල බහුකාර්ය ගොඩනැගිල්ලේ බිම්මහල ඉදිකිරීම. | - | 2014.09 | 1,500,000 | 2009 ඔක්තෝබර් 06 දින විවෘත කර වසා දමා ඇති අතර නැවත 2014 සැප්තැම්බර් මාසයේදී ඉහළ මාලයේ වැඩ කොටසක් සිදුකර තිබුණි. එසේ වුවද විගණිත දින වූ 2015 මාර්තු 18 දින වන විට ඉදිකිරීමේ වැඩ අවසන් නොකර වසා දමා තිබුණි. |
| මාතර දිස්ත්‍රික්කයේ පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ බෙරලපනාතර සතිපොල ප්‍රතිසංස්කරණය සහ වෙළඳ සංකීර්ණය ඉදිකිරීම. | 20,475,369 | 2014.10.07 | - | ගිවිසුම ප්‍රකාරව 2015 ජනවාරි 02 දින වන විට ඉදිකිරීම අවසන් කළ යුතු වුවත් 2015 ඔක්තෝබර් 19 දින වන විටත් අත්තිවාරම් මට්ටම දක්වා පමණක් වැඩ නිම කර තිබුණි. |
| වනජීවී හා වන රොද සංරක්ෂණ වැඩසටහන යටතේ මාතලේ දිස්ත්‍රික්කයේ නාඋල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පුබ්බිලිය හා හැලඔගහවත්ත වැව් පිළිසකර කිරීම හා ඉදිකිරීම - | 10,780,000 | 2014.07.15 | - | ඇස්තමේන්තු සකස් කිරීමේ ප්‍රමාදය 2014 දෙසැම්බර් වන විටද ව්‍යාපෘතිය ආරම්භක අවස්ථාවේ පැවතුණි. |
| දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් වසම් 09 ක් ආවරණය වන පරිදි අලි වැට ප්‍රතිසංස්කරණය කිරීම හා තල්කොටේ වනජීවී කාර්යාලයට | 27,500,000 | 2014 වර්ෂය | 18,167,743 | - |

| | | | | |
|---|---|---|---|---|
| නේවාසිකාගාරයක් ඉදිකිරීම | | | | |
| දිප්පිටිය සතිපොල ඉඩකඩ ප්‍රමාණය වැඩිකිරීම. | 12,300,000 | 2014 අප්‍රේල් | 12,030,541 | විගණිත දින වූ 2015 මාර්තු 19 දින වන විට පොලොව මට්ටමට පමණක් ඉදිකිරීම් කර තිබුණි. |
| කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කොට්ඨාශයේ තුත්තිරිපිටිය බස්නැවතුම් පොල ඉදිකිරීම | 24,440,263 | 2014.04.02 | - | ගිවිසුම ප්‍රකාරව 2014 අගෝස්තු 31 දින වන විට ඉදිකිරීම නිමකළ යුතු වුවත් විගණිත දිනය වූ 2015 මාර්තු 19 වන විටත් එහි වැඩ කටයුතු නිමකර නොතිබුණි. |
| කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කොට්ඨාශයේ බුලත්කොහුපිටිය ආදාහනාගාරය ඉදිකිරීම. | 21,469,815 | 2014.04.03 | - | විගණිත දිනය වූ 2015 මාර්තු 20 වන විටත් එහි වැඩ කටයුතු නිමකර නොතිබුණි. |
| කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කොට්ඨාශයේ බුලත්කොහුපිටිය සති පොල ඉදිකිරීම. | 34,385,051 | 2014.01.01 | - | - |
| මොණරාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කුඹුක්කන දෙගල්අරඹ සිට මාගල්ආර දක්වා විදුලිවැට ඉදිකිරීම | - | 2014වර්ෂය | 5,411,832 | විදුලිවැට ඉදිකිරීමට පෙර වනසංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා නොගැනීම, වැටකණු හා උපාංග මිලදී ගෙන තිබු නමුත් විගණන දිනය වූ 2015 මාර්තු 25 දින වන විටත් අදාල ඉදිකිරීමේ කටයුතු ආරම්භ කර නොතිබුණි. ඉදිකිරීම් සඳහා අනුමැතිය ලබාගැනීමටත් පෙර මිලදී ගැනීම් සිදුකර තිබුණි. |
| මොණරාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රත්තනපිටිය ජල යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම. | 1,485,990 | 2014.09.09 | 1,267,567 | - |
| මහනුවර දිස්ත්‍රික්කයේ මිණිපේ, උඩදුම්බර, මැද දුම්බර යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල කි.මීටර් 48 ක් ආවරණය වන පරිදි විදුලි | 5,724,098 | 2014.09.22 | - | යෝජනා කර තිබූ විදුලි වැටවල් ඉදිකිරීමේ ගිවිසුම් ප්‍රකාරව 2014 ඔක්තෝබර් 22 දින සැපයීමට තිබූ |

| | |
|---|---|
| සැටලයිට් ඉදිකිරීම | 2.5mm High Tensile Galvanized Wire, පරීක්ෂණ දිනය වූ 2015 ජුනි 01 දින තෙක් සැපයීමට අපොහොසත් වීම මත මුළු ව්‍යාපෘතියම ඇණහිට තිබූ අතර, රජය විසින් ඉටුකර ගැනිමට බලාපොරොත්තු වූ අරමුණුද ඉටු වී නොතිබුණි. මෙහිදී ප්‍රසම්පාදන හා තාක්ෂණික ඇගයීම් කමිටුව තම වගකීම් නිසි පරිදි ඉටුකර නොතිබුණු බව විගණනයේ දී තහවුරු විය. නිසි කල මෙම ව්‍යාපාතිය ඉටුකර ගැනිමට හැකි වූයේ නම් අලි ප්‍රහාර මගින් සිදු වූ මිනිස් ජීවිත හානි 2 ක් වලක්වා ගැනීමට අවස්ථාව තිබූ බව නිරීක්ෂණය විය. |

**(ඇ) මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

------------------------------------------------------------------------

ඉදිකිරීම් සම්බන්ධව ලංකා විදුලි බල මණ්ඩලය සහ ජාතික ජල සම්පාදන හා ජලප්‍රවාහන මණ්ඩලයට මුදල් නිදහස් කර තිබුණත් වැඩ පිළිබඳ නිසි ප්‍රගතියක් වාර්තා වී නොතිබුණු අවස්ථා නිරීක්ෂණය විය.

(i) කළුතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2014 මාර්තු 20 දින ජල ව්‍යාපෘති 05 ක් සඳහා රු.1,831,400 ක් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත ගෙවා තිබුණි. නමුත් එම ව්‍යාපෘති 2015 ජුනි 01 දින වන විටත් ආරම්භකර නොතිබුණි. එසේම 2012 මැයි 21 දින ජල ව්‍යාපෘතියක් සඳහා රු.1,000,000 ක් ගෙවා තිබුණද එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණු අතර මණ්ඩලය විසින් 2014 අප්‍රේල් 21 දින එම මුදලින් රු.107,143 ක් අඩු කොට රු.892,857 ක් කළුතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ආපසු එවා තිබුණි. එම මුදල නැවත 2014 නොවැම්බර් 25 දින සිට සති 07 ක් ඇතුළත ව්‍යාපෘතිය නිම කිරීමේ එකගතාවය මත ගිවිසුමකට එළඹ මණ්ඩලය වෙත ගෙවා තිබුණු නමුත් 2015 ජූනි මාසය වන විටත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි.

(ii) කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 05 කට අදාලව විදුලි යෝජනා ක්‍රම 12 ක් සඳහා විදුලිබල මණ්ඩලයට රු.2,892,798 ක් ගෙවා වර්ෂයකට අධික කාලයක් ගත වී තිබුණද, ඒවායේ වැඩ අවසන් කර විදුලි සැපයුම ලබා දීමට 2015 ඔක්තෝබර් මාසය වන විටද කටයුතු කර නොතිබුණි.

(iii) යටියන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ජල යෝජනා ව්‍යාපෘති 04 ක් ක්‍රියාත්මක කිරීමට 2014 ජූනි 25 දින ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත රු.8,624,000 ක් ගෙවා තිබුණි. එසේ වුවද, 2015 ඔක්තෝබර් 20 දින වන විටත් අදාල

ව්‍යාපෘතීන් ආරම්භ කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

(iv) කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙහි ව්‍යාපෘති සඳහා අත්තිකාරම් වශයෙන් රු.1,188,000 ක් ලබාගෙන මාස 3 ½ කට අධික කාලයක් වැඩ ආරම්භ නොකර අවස්ථා 06 කදී රජයේ මුදල් අවභාවිතා කර තිබුණි.

**(ඈ) ව්‍යාපෘති නිම කර තිබුණත් අරමුණු ඉටු නොවූ ව්‍යාපෘති**

පහත දැක්වෙන ව්‍යාපෘතිවල ඉදිකිරීම් නිමවී තිබුණත් ඒවායින් බලාපොරොත්තු වූ අරමුණු ඉටු වී නොතිබුණි.

(i) නුවරඑළිය දිස්ත්‍රික්කයේ අඹගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වැසි කාලයේදී බ්ලැක්වෝටර් ඇල උතුරායාමෙන් නිවාස යටවීම වැලැක්වීම සඳහා ඇල විශාල කිරීමට රු.729,000 ඇස්තමේන්තු වටිනාකමක් යටතේ කොන්ත්‍රාත් ලබාදී තිබුණි. විගණිත දිනය වූ 2015 අප්‍රේල් 08 දින වන විටත් ඇල මධ්‍යයේ පැවති කළුගලක් කඩා ඉවත් නොකිරීම මත අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි.

(ii) නුවරඑළිය දිස්ත්‍රික්කයේ හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.990,000 වියදමින් හඟුරන්කෙත වැව පිවිසුමෙහි වාහන අංගනයක් ඉදිකර තිබුණි. අදාල අංගනය තුළ වාහන තුනකට වඩා වැඩි ප්‍රමාණයක් නවතා තැබීමට නොහැකි බැවින් ව්‍යාපෘතිය මගින් අපේක්ෂිත අරමුණ ඉටුවී නොතිබුණි.

(iii) නුවරඑළිය දිස්ත්‍රික්කයේ 2014 වර්ෂයේදී ගැබිනි හා කිරිදෙන මව්වරුන් සඳහා පෝෂණ මල්ල ලබාදීමේ වැඩසටහන නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම සේවා වසම් 72 න් වසම් 21 තුළ පමණක්ද හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම සේවා වසම් 131 න් වසම් 36 ක පමණක් ක්‍රියාත්මක කර තිබුණි.

**(ඉ) ව්‍යාපෘතිවල ගුණාත්මකභාවය පිළිබඳ ගැටළු**

පහත දැක්වෙන ව්‍යාපෘතිවල ගුණාත්මකභාවය සම්බන්ධයෙන් ගැටළු පැවතුණි.

(i) නුවරඑළිය දිස්ත්‍රික්කයේ විගණන පරීක්ෂාවට ලක් කරන ලද ව්‍යාපෘති 469 ක් සඳහා රු.127,564,526 ක් කොන්ක්‍රීට් මිශ්‍රණ සඳහා ගෙවීම් කර තිබුණද, ඒවයේ නිසි ප්‍රමිතිය තහවුරු කර ගැනීම සඳහා රසායනාගාර පරීක්ෂණ වාර්තා ලබාගෙන නොතිබුණි.

(ii) ඉංජිනේරුවකුගේ අනුමැතියකින් තොරව රු.1,964,000 ඇස්තමේන්තු වටිනාකමකින් ඉදිකළ නුවරඑළිය දිස්ත්‍රික්කයේ වලපන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මුංවත්ත ප්‍රජා ශාලා ගොඩනැගිල්ලේ කණු අතර පරතරය අඩි 22 ක් වීම නිසා කොන්ක්‍රීට් තට්ටුව මැදින් පහත් වී තිබුණි.

(iii) නුවරඑළිය දිස්ත්‍රික්කයේ අඹගමුව බඳුහෙල මීරියගහ මාර්ගයේ කොන්ක්‍රීට් ගල් ඇතිරීම සඳහා රු.198,000 ක් වැය කර තිබුණද, මාර්ගය සම්පූර්ණයෙන්ම ගිලා බැස තිබුණි.

(iv) නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කුම්වුඩ් මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපාතිය 2014 දෙසැම්බර් 13 දිනට සාර්ථකව නිමකළ බව දක්වමින් රු.19,967,525 ක්

කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි. නමුත් විගණිත දිනය වූ 2015 මැයි 20 දින වන විට මාර්ගය ඉදිකර මාස 06 ක් ගත වීමට ප්‍රථම දැඩිව අබලන්ව පැවතුණි.

(v) දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහන යටතේ පුත්තලම නාගරික බල ප්‍රදේශයේ පිහිටි වැව් 07 ක් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රු.10,918,968 ක ගිවිසුම්ගත මුදලකට ප්‍රජාපාදක සමිතිවලට කොන්ත්‍රාත් ලබාදී රු.5,926,723 ක් ගෙවා තිබුණි. බොහෝ වැව්වල සීමා මායිම් සලකුණු නොකොට, අනවසර පදිංචිකරුවන් ඉවත් නොකර ප්‍රමිතියකින් තොරව වැව් අභ්‍යන්තරයෙන් කපා ඉවත් කරන ලද පස් වැව් බැම්ම මත අතුරා තිබුණි. එමෙන්ම මධ්‍යම පරිසර අධිකාරියෙන් සහ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව වැව් දෙකක් බොරළු සහ පස් දමා ගොඩකර තිබුණි. එම අනවසර පදිංචිකරුවන් පදිංචි වීම සහ අනවසර ගොඩ කිරීම නිසා අක්කර 01 පර්චස් 25 ක් විශාල වූ වැවක් පර්චස් 04 ක් දක්වාද අක්කර 54 ක් විශාල වූ වැවක් අක්කර ¼ ක් දක්වාද කුඩා වී තිබුණි.

(vi) ගොඩනැගිලි සම්මත පිරිවිතරයන්ට අනුව ඉදිකිරීමක් සඳහා SLS සහතිකය සහිත බ්ලොක් ගල් පමණක් යොදාගත යුතු වුවද කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රු.15,012,138 ක් වටිනා ගොඩනැගිලි 13 ක් ඉදිකිරීම සඳහා ප්‍රමිතියකින් තොර බ්ලොක්ගල් භාවිතා කර තිබුණි.

**(ඊ) අරමුණුවලට පටහැනි ඉදිකිරීම්**

--------------------------------

අඹගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලක්ෂපාන පොසේෂට් මාර්ගයේ එක් පෞද්ගලික නිවසකට යන මාර්ගයක් කොන්ක්‍රීට් කිරීම සඳහා රු.297,000 වැය කර තිබුණි.

**(උ) ව්‍යාපෘති සඳහා වැඩියෙන් ගෙවීම**

----------------------------------

අඹගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පරීක්ෂා කරන ලද ව්‍යාපෘති 08 ක සාවද්‍ය රසායනාගාර පරීක්ෂණ වාර්තා මත පදනම්ව කොන්ක්‍රීට් සඳහා රු.5,140,000 ගෙවා තිබුණි.

(ඌ) **ව්‍යාපෘති අවිච්ඡේද කිරීම්**

---------------------------

2014 පෙබරවාරි 13 දිනැති ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ ලේකම්වරයාගේ "2014 වර්ෂයේ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ අත්වැලෙහි" දොරින් දොරට ගමින් ගමට ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කොන්දේසි යටතේ වූ දෙවන කොන්දේසිය ප්‍රකාරව, අනුමත සියළු ව්‍යාපෘති සමාලෝචිත වර්ෂය තුළදීම අවසන් කළ යුතු බවත්, ව්‍යාපෘති කාර්යයන් ඉදිරි වසරට අවිච්ඡේද නොවීමට වග බලාගත යුතු බවටත් උපදෙස් දී තිබුණි. එම උපදෙස්වලට අනුකූල නොවන ලෙස මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් රු.119,117,328 ක් වටිනා ව්‍යාපෘති 23 ක් ද කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් රු.64,607,605 ක් වටිනා ව්‍යාපෘති 66 ක් ද, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.79,592,077 ක් වටිනා ව්‍යාපෘති 21 ක්ද, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.73,029,472 ක් වටිනා ව්‍යාපෘති 41 ක්ද, කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 30 කට අදාලව රු.757,272,922 ක් වටිනා ව්‍යාපෘති 1,696 ක්ද, මාතලේ දිස්ත්‍රික්කයේ රු.278,384,336 ක් වටිනා ව්‍යාපෘති 463 ක්ද අවිච්ඡේද කර තිබුණි.

**3.13 කාර්යසාධනය**

**-----------------**

2014 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්**

**-----------------------------------------------**

අමාත්‍යාංශය සිය අරමුණුවලට අදාල කාර්යවලින් බැහැරව ක්‍රියා කළ අවස්ථා නිරීක්ෂණය වූ අතර, නියැදි පරීක්ෂණවලදී එසේ අනාවරණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ

(අ) දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ විෂය පථයට අයත් නොවූ ආපදා කළමනාකරණ කටයුත්තක් වූ නියඟයෙන් විපතට පත් ජනතාවට ජල බහාලන බඳුන් ලබාදීම සඳහා දෙපාර්තමේන්තුව විසින් රු.106,873,148 ක් වැයකර තිබුණු අතර මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මෙම කාර්ය සඳහා වැය කරන ලද රු.106,873,148 න් රු.56,390,682 ක් 105–2-1-1-2105 "ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම්" වැය විෂයය වෙනුවෙන් ලබාදෙන ලද මූලධන ප්‍රතිපාදනවලින්, අමාත්‍යාංශයේ හෝ මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව උපයෝජනය කර තිබුණි.

(ii) ඉතා හදිසි වූ හෝ ඉතා විශේෂ වූ කරුණු වෙනුවෙන් රු.මිලියන 90 කට වැඩි ඇස්තමේන්තු වටිනාකමක් සහිත මෙම ප්‍රසම්පාදනය රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 මාර්ගෝපදේශය ප්‍රකාරව අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් කළයුතු වුවත් එසේ නොකර දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් ඉටුකර තිබුණි. එසේම එවැනි අවස්ථාවලදී එයට හේතු වූ කරුණු පැහැදිලිව ලිඛිතව වාර්තා කළ යුතු අතර එහි පිටපතක් විගණකාධිපති වෙත එවිය යුතු වුවත් දෙපාර්තමේන්තුව විසින් එම අවශ්‍යතා ඉටු කර නොතිබුණි.

(iii) ජල භාජන සැපයුම්කරුවකු වෙත, අත්තිකාරම් ලබාදීමේ සුරක්ෂණයක් (Advance Payment Guarantee) ලබා ගැනීමකින් තොරව රු.මිලියනයක අත්තිකාරමක් ගෙවා තිබුණි.

(iv) විගණනය වෙත ලද තොරතුරු අනුව මිලදීගත් ජල භාජන 224,694 ක් සඳහා ගෙවා තිබූ මුදල රු.105,770,708 ක් වූ අතර එයින් දළ වශයෙන් රු.13,867,385 ක් වූ ජල භාජන 25,894 ක් නියමිත දිස්ත්‍රික්ක වෙත ලැබුණු බවට තහවුරු කිරීම් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(v) ජල භාජන අදාල දිස්ත්‍රික්ක වෙත ප්‍රවාහනය කිරීම සඳහා මිලගණන් කැඳවීමකින් තොරව ප්‍රවාහන ආයතන දෙකක් තෝරාගෙන ප්‍රවාහනය වෙනුවෙන් එම ආයතන වෙත රු.1,102,440 ක් ගෙවා තිබුණි.

(ආ) පළාත් පාලන ආයතන 58 ක් සඳහා කොඩි කණු සඳහා භාවිතා කිරීම පිණිස පිරිවැය රු.36,509,127 ක් වූ ගැල්වනයිස් බට 32,976 ක් 2014 දෙසැම්බර් මාසයේදී මිලදී ගෙන බෙදාහැර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පළාත් පාලන ආයතනවලට කොඩිකණු ලබාදීම දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ විෂය පථයට අයත් කාර්යයක් නොවුනු අතර කොඩිකණු ලබාදෙන

ලෙස දිවයිනේ කිසිදු පළාත් පාලන ආයතනයකින් ඉල්ලීම් ඉදිරිපත් වී නොතිබුණි. ඊට අමතරව කොඩිකණු බෙදාහැරීම සඳහා පළාත් පාලන ආයතන 58 ක් තෝරාගත් ආකාරය පිළිබඳ නිර්නායක නොතිබුණි.

(ii) මෙම මිලදී ගැනීම සඳහා 2014 වර්ෂයේදී ප්‍රතිපාදන සළසාගෙන නොතිබුණු අතර වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් මගින් හා මුළු පිරිවැය ඇස්තමේන්තුවක් අනුමත කර ගෙන ද නොතිබුණි.

(iii) පළාත් පාලන ආයතන 48 කට බෙදාහැර තිබුණු බට 28,310 ක් මුදල් රෙගුලාසි 751 ප්‍රකාරව තොග පොත්වල ඇතුළත් කර නොතිබුණි.

(iv) පළාත් පාලන ආයතන 17 කට ලබාදී තිබුණු බට 5,398 ක් දෙපාර්තමේන්තු අවසරයකින් තොරව වෙනත් පළාත් පාලන ආයතන 30 ක් වෙත බෙදාහැර තිබුණි.

(v) පළාත් පාලන ආයතන 33 කට ලබාදී තිබුණු බට 9,195 එම ආයතනවල සභාපති, උප සභාපති, හෝ සභිකයින් වෙත නිදහස් කර තිබුණු අතර ආයතන 11 කට ලබාදී තිබුණු බට 2,734 ක් දෙපාර්තමේන්තු අවසරයකින් තොරව භාහිර පාර්ශවයන්ට නිකුත් කර තිබුණි.

(ඇ) දිවයිනේ සියළුම ත්‍රී රෝද රථ රියදුරන් සඳහා ජීවිත රක්ෂණ හා විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වාදීම සඳහා අවශ්‍ය තොරතුරු රැස්කිරීමට 2014 දෙසැම්බර් මාසයේදී රු.2,402,400 ක් වැයකර තොරතුරු රැස්කිරීමට ආකෘතිපත්‍ර මිලියන 1.1 ක් දිවයිනේ සියළුම දිස්ත්‍රික්ක වෙත දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් බෙදාහැර තිබුණි. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා 2014 වර්ෂයේ අයවැය ඇස්තමේන්තු මගින් ප්‍රතිපාදන සළසා ගෙන නොතිබුණු අතර වැඩසටහන ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳව කිසිදු ක්‍රමවේදයක් හා සැලැස්මක් සකස් කර නොතිබුණි. 2014 දෙසැම්බර් 31 දින වනවිටත් දිස්ත්‍රික් කාර්යාලවලින් තොරතුරු ගෙන්වාගෙන නොතිබුණු අතර ඒ පිළිබඳව පසු විපරම් කටයුතුද සිදුකර නොතිබුණි. 2015 මාර්තු වනවිට වැඩසටහනේ සියළු කටයුතු අකර්මන්‍ය වී තිබුණු අතර වැයකරන ලද සියළු වියදම් නිෂ්කාර්ය වියදම් බවට පත්වී තිබුණි.

(ඈ) 2015 වර්ෂයේ අයවැය යෝජනාවල ඇතුළත් සමෘද්ධි ප්‍රතිලාභින්ගේ සහනාධාර මුදල් වැඩිකිරීම හා තවදුරටත් සහනාධාර ලබාදිය යුතු පවුල් හඳුනා ගැනීම සඳහා වූ සමීක්ෂණයට අදාලව ආකෘති පත්‍ර මිලියන 2.81 ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් 2014 දෙසැම්බර් මාසයේදී රු.8,227,408 ක් වැයකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මෙම වැඩසටහන 2014 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් මගින් අනුමත වී නොතිබුණු අතර වැඩසටහන ක්‍රියාත්මක කිරීමට වාර්ෂික අයවැය ඇස්තමේන්තු මගින් නිශ්චිත මූල්‍ය ප්‍රතිපාදන සළසා නොතිබුණි.

(ii) ආකෘතිපත්‍ර මුද්‍රණය සඳහා ප්‍රසම්පාදන ලියවිලි නිකුත් කිරීම ඇතුළු ප්‍රසම්පාදනයට අදාල සියළුම කටයුතු එක්දිනක් තුළ ඉටුකර තිබුණි.

(iii) පිරිවැය රු.907,680 ක් වූ ආකෘතිපත්‍ර 312,993 ක් බෙදා හැරීමට කටයුතු නොකර නිෂ්කාර්යව පැවති අතර දිස්ත්‍රික් කාර්යාලවලට නිකුත් කර තිබුණු ආකෘතිපත්‍ර භාවිතා නොකර ආපසු දෙපාර්තමේන්තුවේ ගබඩාවට එවා තිබුණු අවස්ථා ද නිරීක්ෂණය විය.

(iv) මෙම සමීක්ෂණය මගින් හඳුනාගත් නව ප්‍රතිලාභීන් පිළිබඳ සවිස්තර තොරතුරු 2015 මැයි වන විටත් දෙපාර්තමේන්තුව රැස්කර නොතිබුණි. 2015 මැයි වන විට මෙම වැඩසටහන සම්පූර්ණයෙන්ම අත්හැර දමා තිබුණු අතර වැය කර තිබුණු මුදල නිෂ්කාර්ය වියදමක් ලෙස නිරීක්ෂණය විය.

(ඉ) දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2014 නොවැම්බර් හා දෙසැම්බර් මාසවල සිදුකරන ලද ප්‍රචාරණ කටයුතු සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2014 වර්ෂයේ ජීවනෝපාය සංවර්ධන වැඩසටහන්වලට ඇතුළත්ව නොතිබුණු “ ග්‍රාමීය පාලම් 1210 ක් සංවර්ධනය කිරීමේ වැඩසටහන ” සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් සිදුකර තිබුණු රූපවාහිනී ප්‍රචාරක වැඩසටහන් දෙකක් සඳහා රු.5,040,000 ක් ලේකම්වරයාගේ උපදෙස් පරිදි අදාල මාධ්‍ය ආයතන වෙත ගෙවීමට දෙපාර්තමේන්තුව කටයුතු කර තිබුණි.

(ii) “ඉසුරුමත් නිවහනක්” වැඩසටහනේ ප්‍රචාරණ කටයුතු වෙනුවෙන්, දෙපාර්තමේන්තුවේ මාධ්‍ය නිලධාරියාගේ පුද්ගලික අභිමතයට අනුව හා පූර්ව අනුමතියකින් තොරව 2014 නොවැම්බර් මාසයේ සමගාමී දින දෙකකදී පුවත්පත් 09 ක ප්‍රචාරය කළ දැන්වීම් සඳහා දෙපාර්තමේන්තුව විසින් රු.997,476 ක් ගෙවා තිබුණි.

(iii) අමාත්‍යාංශ ලේකම්වරයාගේ උපදෙස් මත සකස් කළ බවට සාවද්‍ය ලෙස සඳහන් කරමින් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ නිසි අනුමැතියකින් තොරව, තත්පර 30 ක රූපවාහිනී කෙටි දැන්වීම් 3 ක් සඳහා නිෂ්පාදන ආයතනයකට රු.707,625 ක් ගෙවා තිබුණු අතර මෙම වැඩසටහන් 2015 මැයි මාසය වන විටත් ප්‍රචාරය කර නොතිබුණි.

(iv) එවකට සිටි ජනාධිපතිවරයාගේ ඡායාරූපයක් සහිතව පුවත්පත් 7 ක පලකර තිබූ දැන්වීම් සඳහා රු.22,896,680 ක් නිරවුල් කිරීම සඳහා දෙපාර්තමේන්තුව බැඳීම් ඇතිකරගෙන තිබුණි.

## 3.14 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

---

අමාත්‍යාංශය විසින් සිදුකර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ එවැනි ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) ලෝක ආහාර වැඩසටහන යටතේ ජපන් රජයෙන් මගින් මාළු ටින් 1,080,864 ක් 2014 ජූලි 09 දින ලෝක ආහාර වැඩසටහනට (WFP) ලැබී තිබුණි. මෙම ආහාර ද්‍රව්‍ය පරිභෝජනය සඳහා සුදුසු බවට ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයෙන් තහවුරුවක් ලබා ගැනීමට ප්‍රථමව ටින් කරන ලද මාළු ටින් 109,536 ක් ව්‍යාපෘතිය මගින් දිස්ත්‍රික්ක තොග ගබඩාවලට නිකුත් කර තිබුණි.

(ආ) අමාත්‍යාංශය මගින් 2014 ජූලි 22 දින “ටොෂිබා ඊ ස්ටුඩියෝ 2007” වර්ගයේ ඡායා පිටපත් යන්ත්‍ර තුනක් එකක් රු.211,680 (එකතු කළ අගය මත බදු සමඟ) බැගින් රු.635,040 ක් ගෙවා පෞද්ගලික ආයතනයකින් මිලදී ගෙන තිබුණි. උක්ත ඡායා පිටපත් යන්ත්‍රයේ තාක්ෂණික පිරිවිතරයන්ට වඩා ඉහල එම වර්ගයේ ඡායා පිටපත් යන්ත්‍රයක් රු.172,480 ක් වැය කොට 2014 ජූලි 22 දින රාජ්‍ය සංස්ථාවකින් මිලදී ගෙන තිබුණි. ඒ අනුව රජයේ නොවන පෞද්ගලික ආයතනයකින් ඡායා පිටපත් යන්ත්‍ර මිලදී ගැනීම නිසා රජයට රු.117,600 ක මූල්‍යමය පාඩුවක් සිදුවී තිබුණි.

(ඇ) නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ කාර්යාල ස්ථාපිත කිරීම සඳහා අමාත්‍යාංශය විසින් මහවැලි අධිකාරිය සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. රජයේ තක්සේරුකරු විසින් අදාල ගොඩනැගිල්ලේ මාසික කුලිය රු.575,000 ලෙස තක්සේරු කර තිබියදී, අමාත්‍යාංශය විසින් මාසිකව රු.642,000 කුලියක් ගෙවීමට යටත්ව ගිවිසුමට එළඹ තිබුණි. තක්සේරුගත කුලියට වඩා රු.67,000 ක් මාසිකව ගෙවීමෙන් 2013 මැයි මාසයේ සිට 2014 ඔක්තෝබර් මාසය දක්වා රු.1,206,000 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඈ) හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දික්හේනපුර ප්‍රධාන මාර්ගයේ 0+850 දක්වා කොටසේ 590 m2 ක ප්‍රදේශයක සාමාන්‍ය ඇස්පෝල්ට් ස්ථර ඝණකම 25.7 mm ක් විය. එම ඝණකම සඳහා අවශ්‍ය ඇස්පෝල්ට් ප්‍රමාණය ටොන් 36 ක් වුවත් ටොන් 58 ක් වෙනුවෙන් වැඩිපුර රු.279,400 ක් (22 x 12,700) ගෙවා තිබුණි. එම මාර්ගයේ 0+850 – 1+850 ප්‍රදේශයේ ඇස්පෝල්ට් ස්ථරයේ භෞතික සාමාන්‍ය ඝණකම 36.6 mm ක් සහ පලල 7.46 mm ක් වූ අතර ගෙවීම් කිරීම සඳහා ඝණකම 48 mm සහ පලල 7.9 mm ක් ලෙස ගෙන තිබුණි. එමගින් අදාල කොන්ත්‍රාත්කාර සමාගමට ඇස්පෝල්ට් වෙනුවෙන් වැඩිපුර රු.3,175,000 ක් ගෙවා තිබුණි. එසේම එම මාර්ගයේ 1+894 – 3+455 දක්වා ප්‍රදේශයේ මාර්ගයේ ඝණකම 40mm ලෙස පවත්වා ගැනීම ප්‍රමාණවත් වුවත් ඝණකම 50mm ලෙසට අධි ඇස්තමේන්තුවක් සකස් කර තිබුණි. නමුත් භෞතික පරීක්ෂාවේදී මාර්ගයේ ඇස්පෝල්ට් ඝණකම 36.6mm ලෙස නිරීක්ෂණය වූ අතර 48mm ඝණකමක් ලෙස සළකා ගෙවීම් කර තිබුණි. ඒ අනුව කොන්ත්‍රාත්කාර සමාගමට ඇස්පෝල්ට් ටොන් 167 ක් වෙනුවෙන් රු.2,120,900 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඉ) රත්නපුර දිස්ත්‍රික්කයේ නිරල්ගම අලුපොත මාර්ගය විධායක ඉංජිනේරු හා පර්යේෂණාගාර නිලධාරීන් සමඟ භෞතිකව පරීක්ෂා කළ අතර එහිදී මාර්ගයේ ඇස්පෝල්ට් ඝණකම 48mm ලෙස නිරීක්ෂණය විය. නමුත් ගෙවීම් කිරීමේදී මාර්ගයේ ඝණකම ලෙස 52 mm හා සම්පීඩ්‍යතා සාධකය 2.35 වෙනුවට 2.38 ලෙස යොදා වැඩිපුර ඇස්පෝල්ට් ටොන් 273 ක් සඳහා රු.3,723,720 ක් ගෙවා තිබුණි. එම මාර්ගයේ සම්පූර්ණ දුර ප්‍රමාණයම සඳහා ABC 7,545 m3 වෙනුවෙන් අධි ඇස්තමේන්තුවක් සකස් කර තිබුණද සත්‍ය වශයෙන් ABC 8,423.9 m3 ක් භාවිතා කළ බව පෙන්වමින් ගෙවීම් කර තිබුණි. ඇස්තමේන්තුව ඉක්මවා භාවිතා කළ ABC 878.9 m3 සඳහා විධිමත් අනුමැතියක් ලබාගැනීමකින් තොරව අදාල කොන්ත්‍රාත්කාර සමාගමට ගෙවීම් කර තිබුණි. එසේම මාර්ගය සඳහා Binder Course ටොන් 146 ක් වෙනුවෙන් ඇස්තමේන්තු කර තිබුණි. මාර්ගය භෞතික පරීක්ෂාවේදී Binder Course යෝජිත ස්ථාන සඳහා භාවිතා කර නොතිබුණු අතර පැය 02 ක කාලයක් තුළ මාර්ගයේ සමස්ථ දුර වූ 6.5 km සඳහා Binder Course ටොන් 146 ක් සැපයූ බවට බිල්පත් ඉදිරිපත් කර තිබුණි. පැය 02 ක් තුළ ටොන් 146 ක් මාර්ගයට සැපයීම ප්‍රායෝගික නොවන අතරම Binder Course මාර්ගයට යෙදූ බවට තහවුරුවකින් තොරව සැපයුම්කරු වෙත රු.1,947,640 ක් ගෙවා තිබුණි.

(ඊ) සමෘද්ධි කොමසාරිස් ජනරාල්වරයාගේ 2013 ජනවාරි 10 දිනැති අංක 2013/1 දරන චක්‍රලේඛයේ 2.1(ii) ප්‍රකාරව 2014 වර්ෂය තුළදී සහණාධාරලාභීන් 108,783 දෙනෙකු වෙනුවෙන් නිවාස ලොතරැයි අරමුදල වෙත රු.1,087,830 මුදලක් ප්‍රේෂණය කර තිබුණි. 2012 වර්ෂයේ සිට නිවාස දිනුම් ඇදීමක් සිදුකර නොතිබුණු අතර 2007 වර්ෂයේ දිනුම් අදින ලොතරැයි ජයග්‍රාහකයකුට ලබාදිය යුතු රු.75,000 මූල්‍ය ත්‍යාගය ලබාදී නොතිබුණි.

(උ) අමාත්‍යාංශයෙන් නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සැලැසුම් අංශයට අනුයුක්ත කළ නිලධාරීන් දෙදෙනෙකු එම අංශයේ සේවය නොකර මහජන නියෝජිතයෙකුට සේවය සපයා 2010 – 2014 කාල පරිච්ඡේදය තුළදි රු.1,785,530 ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි.

(ඌ) අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන විදේශාධාර ව්‍යාපෘතියක් වන ග්‍රාමීය පාලම් වැඩසටහන යටතේ ඉදිකළ පාලම් 210 ක් විවෘත කිරීම හා නව පාලම් 1,000 ක් ගොඩනැගීමේ වැඩ ආරම්භ

කිරීම පිළිබඳව දේශීය පුවත්පත් 09 ක සම්පූර්ණ පිටුවක් මත දැන්වීම් පළකිරීම සඳහා රු.3,768,352 ක් වැය කර තිබුණි. නමුත් ප්‍රගති වාර්තා අනුව මෙම පාලම් 210 න් බොහොමයක වැඩ අවසන් වී නොතිබුණු අතර පාලම් 1,000 සඳහා මූලික ගිවිසුම්ද අත්සන් කර නොතිබුණි. මැතිවරණ කාල සීමාව තුළ අපේක්ෂකයන් ප්‍රවර්ධනය කිරීමට හේතු වන පුවත්පත් දැන්වීම් පල කිරීමෙන් වලකින ලෙස මැතිවරණ කොමසාරිස්වරයා විසින් උපදෙස් ලබා දී තිබියදී, අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරන ලද මෙම ව්‍යාපෘතිය පිළිබඳ පුවත්පත් දැන්වීමට ජනාධිපතිවරණ අපේක්ෂකයෙකුගේ ඡායාරූපයක් ඇතුළත් කර තිබීම නිසා ජනාධිපතිවරණ ප්‍රචාරක කටයුතු වෙනුවෙන් මෙම දැන්වීම් පළකර ඇති බව නිරීක්ෂණය විය.

(එ) දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය ස්ථාපිත කිරීම සඳහා බොරැල්ල කාසල් වීදියේ පිහිටි ගොඩනැගිල්ල සහ සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව පවත්වාගෙන ගිය කාර්යාලය අළුත්වැඩියා කිරීමේ කටයුතු වෙනුවෙන් 2014 වර්ෂයේදී දෙපාර්තමේන්තුව විසින් රු.මිලියන 12.248 ක් වැයකර තිබුණි.

(i) දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය 2014 අප්‍රේල් 27 දින සිට සෙත්සිරිපාය පරිශ්‍රයෙන් ඉවත් කිරීමට හේතු වූ කරුණු විගණනයට පැහැදිලි නොකෙරුණු අතර, ඒ සඳහා ලබාගෙන තිබුණු නිසි අධිකාරී බලය සහිත පූර්ව අනුමැතියක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. සෙත්සිරිපාය පරිශ්‍රයෙන් ප්‍රධාන කාර්යාලය ඉවත් කළද මාසිකව රු.මිලියන 6 කට ආසන්න කුලියක් 2014 ජූලි මාසය දක්වා ගෙවා තිබුණි.

(ii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2 මාර්ගෝපදේශය ප්‍රකාරව. වැඩ සඳහා වන කොන්ත්‍රාත්තු සම්බන්ධයෙන් කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා සුදුසුකම් ලැබීමට නම් "ඉක්ටැඩ්" (ICTAD) ජාතික ලියාපදිංචි කිරීමේ ක්‍රමය යටතේ වලංගු සහ යථායෝග්‍ය ලියාපදිංචියක් ලංසු ඉදිරිපත් කරන අවස්ථාවේදී දේශීය කොන්ත්‍රාත්කරුට තිබිය යුතු වුවද, 2011 සැප්තැම්බර් 24 දින සිට තෝරාගන්නා ලද සමාගමේ, ඉදිකිරීම් අභ්‍යාස සහ සංවර්ධන ආයතනයේ (ICTAD) ලියාපදිංචිය අහෝසි වී තිබුණි.

(iii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 මාර්ගෝපදේශය ප්‍රකාරව, ඉදිකිරීම් කොන්ත්‍රාත්තු සඳහා මිල සැඳහුම් ක්‍රමය යටතේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවක් මගින් මිල ගණන් කැඳවන්නේ නම් මුද්‍රා තැබූ මිල ගණන් 5 කට නොඅඩු සංඛ්‍යාවක් කැඳවිය යුතු වුවද, මෙම ප්‍රසම්පාදනයේදී ආයතන 3 කින් පමණක් මිල ගණන් කැඳවා තිබුණි.

(iv) මිල ගණන් කැඳවීමේ ලිපි සමාගම් වෙත 2014 අප්‍රේල් 07 දින යවා තිබුණත් සමාගම් දෙකක් වෙතින් එදිනට පෙර මිල ගණන් ඉදිරිපත් කර තිබුණි.

(v) මිල ගණන් කැඳවීමේ සිට අත්තිකාරම් ගෙවීම සඳහා වවුචරපත් සකස් කිරීම දක්වා කාර්යයන් 7 ක් එකම දිනකදී ඉටුකළ බව ගොනුව අනුව තහවුරු විය.

(vi) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.7.5 මාර්ගෝපදේශය ප්‍රකාරව, රේඛීය අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයකු හෝ ඒ හා සමාන මට්ටමේ අධ්‍යක්ෂවරයෙකු ද ඇතුළත් තිදෙනෙකුගෙන් සමන්විත දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවක් මගින් ඊට අදාල අනුමැතිය ලබාදිය යුතු වූ නමුත් ඊට පටහැනිව දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සිව්දෙනෙකුගෙන් ප්‍රසම්පාදන කමිටුව සමන්විතව තිබුණි.

(vii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 මාර්ගෝපදේශය ප්‍රකාරව ලංසුවක් ප්‍රතිග්‍රහනය කිරීමෙන් අනතුරුව දෙපාර්ශවය විසින් විධිමත් ලිඛිත ගිවිසුමකට එළඹිය යුතු වුවත් මෙම ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවේදී දෙපාර්තමේන්තුව එවැනි ගිවිසුමකට එළඹ නොතිබුණි.

(viii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4(i) මාර්ගෝපදේශය ප්‍රකාරව, පිළිගත හැකි 'අත්තිකාරම් ගෙවීමේ සුරක්ෂණයක්' ඉදිරිපත් කිරීම මත, කොන්ත්‍රාත් මුදලින් සියයට 20 ක උපරිමයක් වන පරිදි වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරමක් ලබාදිය හැකි වුවද කොන්ත්‍රාත් වටිනාකම වූ රු.3,772,245 කින් රු.2,000,000 ක් හෙවත් සියයට 53 ක අත්තිකාරම් පිළිගත හැකි අත්තිකාරම් ගෙවීමේ සුරක්ෂණයක් ලබා ගැනීමෙන් තොරව ගෙවා තිබුණි.

(ix) එක් පරිශ්‍රයක ඉදිකිරීම් හා අළුත්වැඩියාවන් වෙනුවෙන් අනුමත රු.5,980,030 ක සීමාව ඉක්මවා අනුමැතියකින් තොරව රු.1,629,397 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(x) මෙම ඉදිකිරීම් කටයුතුවල අවසාන ගෙවීම් කිරීමේදී කළ වැඩ පිළිබඳ ඉංජිනේරු වාර්තාවක් ලබාගැනීමකින් තොරව කොන්ත්‍රාත්කරු වෙත මුදල් ගෙවීමට කටයුතු කර තිබුණි.

(xi) එක් අළුත්වැඩියා කටයුත්තකට අදාල කාර්යයන් කොන්ත්‍රාත්කරු විසින් නිමකර නොතිබුණු අතර ලබාදී තිබූ අත්තිකාරමෙන් තවදුරටත් අයකර ගත යුතුව තිබූ රු.1,500,000 ක් අයකරගෙන නොතිබුණි. එසේම මෙම කොන්ත්‍රාත්තුවේ සියළු කටයුතු 2015 මැයි මාසය වන විට අතහැර තිබුණු අතර දෙපාර්තමේන්තුවට අදාල සියළු කාර්යාල එම පරිශ්‍රවලින් ඉවත්කර ගෙන තිබුණද කොන්ත්‍රාත්කරුගෙන් තවදුරටත් අයකරගත යුතුව පැවති ශේෂ අයකරගෙන නොතිබුණි.

(ඒ) දිවිනැගුම ජාතික සම්මේලනය 2014 නොවැම්බර් මාසයේදී පවත්වා තිබුණු අතර ඒ සඳහා දළ වශයෙන් රු.මිලියන 72 ක් වැය කර තිබුණු අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) 2013 අංක 01 දරන දිවිනැගුම පනතේ විධිවිධාන ප්‍රකාරව දිවිනැගුම ප්‍රජා මූල සංවිධාන, දිවිනැගුම ප්‍රාදේශීය සංවිධාන, දිවිනැගුම දිස්ත්‍රික් කමිටු පිහිටුවීමෙන් පසු සියළු ප්‍රජාමූල අනුයෝජිතයන්ගේ එකතුවෙන් දිවිනැගුම සම්මේලනය පැවැත්විය යුතු වුවත්, එම සියළු කරුණු ඉටු කිරීමට පෙර දිවිනැගුම සම්මේලනය පවත්වා තිබුණි.

(ii) සම්මේලනය පැවැත්වීම සඳහා 2014 අයවැය ලේඛනය මගින් නිශ්චිත ප්‍රතිපාදන සළසා නොතිබුණු අතර සම්මේලනයට වැය කිරීමට අපේක්ෂිත සියළු වියදම් ඇතුළත් පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කර ඒ සඳහා පූර්ව අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(iii) අනුයෝජිතයන් 40,000 ක් පමණ සහභාගී කරවීමට අපේක්ෂිතව තිබූ සම්මේලනය සඳහා ප්‍රමාණවත් ආසන පහසුකම් සහිත භූමියක් තෝරා ගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු නොකිරීම හේතුවෙන් තාවකාලික කූඩාරම් හා වේදිකා තැනීම, ශබ්ද විකාශන යන්ත්‍ර, වායුසමීකරණ යන්ත්‍ර ලබාගැනීම සහ පුටු කුලියට ගැනීම හා මිලට ගැනීම වැනි කටයුතු වෙනුවෙන් රු.16,629,435 ක් වැය කර තිබුණි.

(iv) මෙම සම්මේලනය ප්‍රජා මූල අනුයෝජිතයන්ගේ සහභාගීත්වයෙන් පවත්වා තිබුණද සම්මේලනය පිළිබඳව පොදු මහජනතාවට පුවත්පත් මගින් ප්‍රචාරයක් ලබාදීමට

රු.1,954,300 ක් වැයකර තිබුණු අතර එහිදී පුවත්පත් දැන්වීම් ආයතන තෝරා ගැනීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන කිසිවක් අනුගමනය කර නොතිබුණි.

(v) දිවිනැගුම ප්‍රථම සම්මේලනයේ සභාපති ධූරය නිවේදනය කිරීම ඇතුළුව සම්මේලනය පැවැත්වීම මගින් දිවිනැගුම පනතේ විධිවිධාන අනුව ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා කටයුතු කර ඇති බව සනාථ කිරීමට සම්මේලනය පිළිබඳ වාර්තාවක් 2015 මාර්තු වන විටත් සකස් කර නොතිබුණි. ඒ අනුව විධිමත් පරිදි ප්‍රජා මූල සංවිධාන පිහිටුවීමට පෙර අති විශාල මුදලක් වැයකර ජාතික සම්මේලනයක් පැවැත්වීම මතභේදයට තුඩුදෙන කරුණක් විය.

(ඔ) දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2015 වර්ෂය වෙනුවෙන් දිවිනැගුම ප්‍රතිලාභී පවුල්වලට බෙදාදීම සඳහා එකක් රු.5.88 බැගින් දිවිනැගුම ලිත් 5,000,000 ක් මුද්‍රණය කරවා ගැනීම සඳහා ප්‍රකාශන ආයතනයකට 2014 දෙසැම්බර් මාසයේදී අදියර 05 ක් යටතේ එකතුව රු.29,400,000 ක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) උක්ත වියදම සඳහා 2014 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුවලින් ප්‍රතිපාදන සළසා ගෙන නොතිබුණු අතර පූර්ව සැලසුමකින් තොරව දින 12 ක් වැනි කෙටි කාලයක් තුළ අවස්ථා 04 කදී ලිත් ප්‍රමාණය කොටස් වශයෙන් මුද්‍රණය කරවා ගැනීම නිසා සම්පූර්ණ තොගය එකවර ඇණවුම් කිරීමෙන් රජයට ලබාගත හැකිව තිබූ මිල වාසිය අහිමිකරගෙන තිබුණි.

(ii) 2014 දෙසැම්බර් වන විට දිවිනැගුම සහනාධාර ලබන ප්‍රතිලාභී මුළු පවුල් ගණන 1,479,811 ක් වුවද, ලිත් 5,000,000 ක් මුද්‍රණය කර තිබූ අතර එය ප්‍රතිලාභී පවුල් ප්‍රමාණයට වඩා සියයට 338 ක වැඩි වීමකි.

(iii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 මාර්ගෝපදේශය ප්‍රකාරව භාණ්ඩ, වැඩ හා උපදේශක නොවන සේවා ප්‍රසම්පාදනය සඳහා වෙළඳපොල මිල සැඳහුම් ක්‍රමය අනුගමනය කිරීමේදී ප්‍රසම්පාදන කාර්යේ වටිනාකම රු. මිලියන 10 දක්වා පමණක් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවක් මගින් සිදුකළ හැකි බව දක්වා තිබූ නමුත් එම අධිකාරී බලය ඉක්මවා රු.29,400,000 ක් වටිනා උක්ත ප්‍රසම්පාදන කාර්යය දිවිනැගුම දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන කමිටුව විසින් සිදුකර තිබුණි.

(v) මැතිවරණ කොමසාරිස්වරයාගේ 2014 දෙසැම්බර් 02 දිනැති අංක පීආර්ඊ/2015/4බී දරන හා චක්‍රලේඛයට අනුව ජනාධිපතිවරණයක් ප්‍රකාශයට පත්කර ඇති කාලසීමාව තුළ කිසිදු ජනාධිපතිවරණ අපේක්ෂකයකුගේ දේශපාලන ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය වන ආකාරයට ත්‍යාග හෝ ආධාර ලබාදීම සිදු නොකළ යුතු වුවද ජනාධිපතිවරණයට තරඟ කරන එක් අපේක්ෂකයකුගේ ඡායාරූපයක් සහිතව අදාල ලිත් මුද්‍රණය කර තිබුණි.

(vi) දිස්ත්‍රික්ක 25 න් දිස්ත්‍රික්ක 12 ක් සඳහා අවශ්‍යතාවයට වඩා ලිත් 319,593 ක් බෙදාහැර තිබූ අතර ඒ සඳහා රු.1,879,205 ක් වැයකර තිබුණි.

(ඕ) වව්නියාව දිස්ත්‍රික්කයේ ගමින් ගමට දොරින් දොරට වැඩසටහනට ලද රු.මිලියන 100 න් රු.මිලියන 42.135 ක් ජීවනෝපාය සංවර්ධන වැඩසටහනට වියදම් කර තිබුණි. මෙහිදී දිස්ත්‍රික් සැලැසුම් ඒකකය විසින් ප්‍රතිලාභී එක් එක් පවුල් සඳහා රු.49,000 , රු.10,000 , රු.9,000, රු.7,800 , රු.6,500 හා රු.2,500 බැගින් ගෙවා තිබුණි. එහි නිර්දේශිත මුදල් භාරගත් බවට පොදු 36(ආ) ආකෘතියේ අත්සන් යොදා ඊට අඩු මුදලක් ගෙවා තිබීම මත මූල්‍ය අක්‍රමිකතාවයක් සිදුකර

ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය. විගණන පරීක්ෂාවලදී රු.6,760,000 ක් පොදු 36 ආකෘතියට අනුව ප්‍රතිලාභීන්ට ගෙවා ඇති බව දැක්වුවද සත්‍ය වශයෙන් ප්‍රතිලාභීන්ට ලැබී තිබූ මුදල රු.4,061,000 කි. එසේම ගෙවීම් ලබාගත් බවට ගෙවීම් වවුචරය සමග ඉදිරිපත් කළ ලේඛනයේ අත්සන් සහ සමෘද්ධි බැංකුවෙන් මුදල් ලබාගත් බවට ඉදිරිපත් කරනු ලැබූ අත්සන් ලේඛනයේ අත්සන් අතර වෙනසක් පැවැතුණි.

## 3.15 අවිධිමත් ගනුදෙනු

-------------------

අමාත්‍යාංශය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

### (අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම

----------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) දේශපාලන නියෝජිතයන් හා රජයේ නිලධාරීන්ට 2014 වර්ෂයේ රජයේ සංවර්ධන යෝජනා ක්‍රම පිළිබඳව දැනුවත්කිරීමේ වැඩමුළුව සඳහා ආහාර පාන සැපයීම වෙනුවෙන් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයට ගෙවිය යුතු වටිනාකමෙන් සියයට 38.6 ක් එනම් රු.1,000,000 ක් අත්තිකාරම් ලෙස ගෙවා තිබුණි.

(ii) එපිටවත්ත කම්මල් ගම්මානයට දුනුකොළ තුනී කිරීමේ යන්ත්‍රයක් මිලදී ගැනිම සඳහා යන්ත්‍රයේ මුළු වටිනාකමින් සියයට 50 ක් එනම් රු.554,064 ක අත්තිකාරමක් ලෙස ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයට ගෙවා තිබුණි. එසේ වුවත් මාස 06 ක ප්‍රමාදයකින් පසුව භාණ්ඩ ලැබී තිබුණි.

(iii) මරදගහමුල සහල් ගබඩා කිරීමේ සංකීර්ණයට අනුබද්ධිතව සහල් විකිනීමේ වෙළඳ කුටි රුපියල් මිලියන 115 ක් වැයකර ඉදි කිරීමේදී අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවකින් බලය ලබා ගෙන නොතිබුණි.

(iv) මරදගහමුල සහල් අලෙවි කිරීමේ වෙළඳ කුටි ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව ලංසු කැඳවීමෙන් තොරව රාජ්‍ය සංස්ථාවක් වෙත ප්‍රදානය කර තිබුණු අතර ඒ සඳහා එම සංස්ථාවට කොන්ත්‍රාත් මුදලින් සියයට 43.5 ක් එනම් රු. මිලියන 50 ක් අත්තිකාරමක් ලබා දී තිබුණි.

(v) නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ අනෙකුත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 4 ට අදාලව රු.1,084,399,860 ක් වටිනා ව්‍යාපෘති 2,608 ක් කමිටු නිර්දේශයකින් තොරව අනුමත සමිතිවලට ලබාදී තිබුණි.

(vi) පානදුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2.14.1 මාර්ගෝපදේශය අනුව රු.මිලියන 2 ඉක්මවූ ව්‍යාපෘති සඳහා විවෘත ටෙන්ඩරයකට ඉඩ සැලසීම වෙනුවට ව්‍යාපෘති කොටස් කර ප්‍රජාපාදක සමිතිවලට ලබාදී තිබුණි.

(vii) අමාත්‍යාංශ ප්‍රතිපාදන මගින් පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය විසින් පළාත් පාලන ආයතන 77 ක් වෙත බෙදා හැරීමට රු.44,347,882 ක් වටිනා ගැල්වනයිස් බට 40,056 ක් මිලදී ගැනීමේදී එම ප්‍රසම්පාදනය කොටස් 06 කට බෙදා වරින්වර

ප්‍රසම්පාදනය කිරීමෙන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.1 හා 4.4 මාර්ගෝපදේශය මගහැර කටයුතු කර තිබූ අතර ඒ නිසා මුළු බට තොගයම එකවර ටෙන්ඩර් කිරීමෙන් ලබා ගත හැකිව තිබූ මිල වාසිය අහිමි වී තිබුණි.

(viii) වෙළඳපල මිල සැඳහුම් ක්‍රමය අනුගමනය කිරීමේදී දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ අධිකාරී සීමාව රු.මිලියන 10 ක් වුවද එම සීමාව ඉක්මවා අවස්ථා 3 කදී එකතුව රු.මිලියන 76.997 ක් ප්‍රසම්පාදන, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු අනුමැතිය මත ඉටුකර තිබුණි.

(ix) ලංසු කැඳවීමේදී මුද්‍රාතැබූ මිලගණන් ලබාගත යුතු වුවත්, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් අවස්ථා 12 කදී එකතුව රු.මිලියන 138.305 ක් වූ ප්‍රසම්පාදනවලදී මුද්‍රා තැබූ මිල ගණන් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

(x) මුල් කොන්ත්‍රාත්තුව ප්‍රධානය කිරීමේ දින සිට මාස 06 ක කාලයක් ඇතුළත නැවත ඇණවුම් කිරීමක් කරන්නේ නම් එය මුල් කොන්ත්‍රාත්තුවේ වටිනාකමින් සියයට 50 නොඉක්මවිය යුතු වුවත්, තෙවැනි අධියරේදී ගැල්වනයිස් බට 6,840 ක් සඳහා මිල කැඳවීම් කර මිලදී ගැනීමෙන් අනතුරුව සිව්වන අධියරේදී එම මිල කැඳවීම් පදනම් කර ගෙන රු.මිලියන 9.4 ක් වටිනා බට 8,504 ක් හෙවත් සියයට 124ක් දක්වා මිලදී ගැනීමට කටයුතු කර තිබුණි.

(xi) ලංසු විවෘත කිරීමේ අවස්ථාවට ලංසුකරුවන්ට හෝ පැමිණි ඔවුන්ගේ නියෝජිතයන් සහභාගි කරවා ගෙන ඔවුන් ඉදිරිපිට ලංසු විවෘත කළ යුතු වුවත් අවස්ථා 8 කදී එකතුව රු. මිලියන 69.1 ක් වටිනා ප්‍රසම්පාදනවලදී ලංසුකරුවන් සහභාගි කරවාගෙන ලංසු විවෘත කළ බව සනාථ වී නොතිබුණි.

(xii) දැයට කිරුළ ව්‍යාපෘතිය සඳහා කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අධීක්ෂණය යටතේ රු.24,440,263 ක වියදමින් තුත්තිරිපිටිය බස්නැවතුම්පල ඉදි කිරීමටද රු.13,029,836 ක වියදමින් දිප්පිටිය සතිපොල ඉදිකිරීමට ද රාජ්‍ය සංස්ථාවක් සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. මෙම ව්‍යාපෘති ඇස්තමේන්තු කිරීම හා අධීක්ෂණය කිරීම ආදී සියළු කටයුතු රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් තොරව පවරා දී තිබුණු අතර එම ආයතනය විසින්ද ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් තොරව හා විධිමත් පරිදි හැකියා සහතිකයක් ලබා ගැනීමකින් තොරව ප්‍රදේශයේ පදිංචිකරුවන් වෙත කොන්ත්‍රාත්තුව පවරා දී තිබුණි.

(xiii) කෑගල්ල දිස්ත්‍රික් තුත්තිරිපිටිය බස්නැවතුම්පොල ඉදිකිරීම සඳහා 2014 අප්‍රේල් 10 දින කොන්ත්‍රාත්කරු වෙත ප්‍රාරම්භක අත්තිකාරම් ලෙස කොන්ත්රාත් වටිනාකමින් සියයට 20 ක් වූ රු.4,192,155 ක් ගෙවා තිබුණද දෙවන හා තෙවන බිල්පත් වලින් ඉන් රු.2,192,155 ක් පමණක් අයකර තිබූ අතර විගණිත දිනය වූ 2015 මාර්තු 19 වන විටත් ඉතිරි අත්තිකාරම් මුදල අයකරගෙන නොතිබුණි.

(xiv) කෑගල්ල දිස්ත්‍රික්කයේ බුලත්කොහුපිටිය සතිපොල සහ දිප්පිටිය සතිපොල ඉදිකිරීම සඳහා සියයට 20 ක ප්‍රාරම්භක අත්තිකාරම් ලෙස පිළිවෙලින් රු.5,897,950 ක් සහ රු.2,055,763 ක් 2014 ජූනි මාසයේදී කොන්ත්‍රාත්කරුවන්ට ගෙවා තිබුණි. විගණිත දින වූ 2015 මාර්තු 20 දින වන විට අදාල ඉදිකිරීම් අතරමග නතර කර තිබූ අතර පිළිවෙලින් රු.170,950 ක් සහ රු.834,963 ක් පමණක් අයකර තිබුණි. ඒ අනුව ප්‍රාරම්භක

අත්තිකාරම් මුදලෙන් රු.5,727,000 ක් සහ රු.1,220,800 ක් කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගත යුතුව තිබුණි.

(xv) කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 මාර්ගෝපදේශයට පටහැනි ලෙස විධිමත් ඇප සුරක්ෂණයක් ලබා ගැනිමකින් තොරව ඉදිකිරීම් 21 ක් වෙනුවෙන් වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස එකතුව රු.6,735,763 ක් ගෙවා තිබුණි.

**(ආ) අධිකාර බලය නොමැති වූ ගනුදෙනු**

----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) බටහිර රන් අරුණ මගින් බස්නාහිර පළාත තුළ සිදුකරනු ලබන සංවර්ධන වැඩසටහන්වල ඇගයීම් කටයුතු සඳහා පිහිටුවන ලද ස්ථාවර කමිටුවට සහ එහි උපකමිටුවලට සහභාගීවීමේ දීමනා වශයෙන් එම සාමාජිකයන්ට 2014 සහ 2015 ජනවාරි මාසයේදී රු.806,516 ක් ගෙවා තිබුණි. එම ගෙවීම සඳහා 2013 ජනවාරි 17 දිනැති අංක 03/2013 දරන ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් පිළිබඳ අමාත්‍යවරයාගේ එනම් මෙම අමාත්‍යාංශයට අදාල නොවන අමාත්‍ය මණ්ඩල සංදේශයක් පදනම් කර ගෙන ගෙවීම් සිදු කර තිබුණි.

(ii) ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ අලි මිනිස් ගැටුම අවම කිරීමේ අදහසින් රු.24,782,878 ක ඇස්තමේන්තු වටිනාකමක් වූ විදුලි අලි වැට ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව නගර හා කඩවත්සතර ප්‍රාදේශීය කාර්යාලය විසින් රු.මිලියනය නොඉක්මවන පරිදි කොටස් 18 කට වෙන්කර ග්‍රාමීය ප්‍රජා පාදක සමිතිවලට පවරා තිබුණු නමුත් අවසානයේදී එම කොන්ත්‍රාත් සියල්ලම එකම උප කොන්ත්‍රාත්කරුවකු විසින් ඉටුකර තිබුණි. 2014 වර්ෂයේදී ඒ සඳහා රු.9,725,177 ක් ගෙවා තිබුණි. මෙම අලිවැට ඉදිකිරීම සඳහා වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 2014 අගෝස්තු මාසයේදී ලබාදුන් අනුමැතිය 2014 සැප්තැම්බර් මාසයේදී අවලංගු කර තිබීම නිසා ගෙවන ලද වටිනාකමට සමානව සැපයුම්කරු විසින් වැඩබිමට භාණ්ඩ සපයා තිබුණත් එම භාණ්ඩ 2015 ඔක්තෝබර් මාසය දක්වාම නිෂ්ක්‍රීයව පැවතුණි.

(iii) 2014 වර්ෂය සඳහා දෙපාර්තමේන්තුවේ අනුමත ක්‍රියාකාරී සැලැස්මක් මගින් අනුමත වී නොතිබුණු, දිවිනැගුම සහනාධාර ලාභීන්ගේ නිවාස සංවර්ධනය කිරීමේ වැඩ සටහනක් වශයෙන් ක්‍රියාත්මක කර තිබුණු "ඉසුරුමත් නිවහනක් " වැඩසටහන යටතේ දිවිනැගුම ප්‍රජාමූල බැංකු සංගම්වල අරමුදල් උපයෝගී කරගෙන සහනාධාරලාභී පවුල් 1,197,111 ක් වෙත එක් පවුලකට රු.2,500 බැගින් රු.2,992,777,500 ක් ගෙවා තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

- එක් පවුලකට රු.10,000 බැගින් ලබාදීමට සැලැසුම් කර තිබුණු සමස්ථ වැඩසටහන සඳහා රු.බිලියන 15 ක් වැය කිරීමට අපේක්ෂා කර තිබුණ ද වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයාට රේඛීය අමාත්‍යාංශයෙන් හෝ මහා භාණ්ඩාගාරයෙන් අධිකාරී බලය ලබාදී නොතිබුණි.

- මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට පෙර අවශ්‍ය ප්‍රතිපාදන සළසාගෙන නොතිබුණු අතර වියදම් දැරීම සඳහා මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය ලබාගෙන නොතිබුණි.

- නිශ්චිත ප්‍රතිලාභීන් සංඛ්‍යාවකට පමණක් අදාලවන මෙම වැඩසටහන පිළිබඳව දිවයිනේ සමස්ථ ජනතාව දැනුවත් කිරීම සඳහා ප්‍රචාරණ දැන්වීම් වෙනුවෙන් රු.997,476 ක් වැයකර තිබුණි. ඊට අමතරව 2014 නොවැම්බර් 22 දිනැති අංක PRE/43 දරන මැතිවරණ කොමසාරිස්වරයාගේ ලිපිය අනුව ජනාධිපතිවරණ කාලසීමාව තුළ රාජ්‍ය දේපල පක්ෂ/අපේක්ෂක ප්‍රවර්ධනයට යොමු නොකළ යුතු බව දන්වා තිබුණද ඊට පටහැනිව එක් අපේක්ෂකයෙකුගේ ඡායරූපය ඇතුළත් දැන්වීම් මුද්‍රිත මාධ්‍යවල පලකර තිබුණි.

- සමස්ථ වැඩසටහනේ අධීක්ෂණය, ප්‍රගතිය වාර්තා කිරීම හා පසුවිපරම් කිරීමේ කටයුතු සිදුකළ යුතු වුවත් 2015 මාර්තු මාසය වන විටත් වැඩසටහනේ ප්‍රගතිය වාර්තා කර නොතිබුණු අතර රු.බිලියන 3 කට ආසන්න මුදලක් වැයකර තිබුණු මෙම වැඩසටහන සම්පූර්ණයෙන්ම නවතා තිබුණි.

(iv) අමාත්‍යාංශයේ අභ්‍යන්තර චක්‍රලේඛ අංක 01/2012 මගින්, වැය කරන ලද මුළු මුදලින් සියයට 2 ක් පරිපාලන වියදම් ලෙස ආයතනය වෙත රඳවා ගැනීමට හැකි බව නියම කර තිබියදී මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට හිමිව තිබූ මුළු වියදම මත පරිපාලන වියදම් වන රු.9,477,392 වෙනුවට රු.12,033,027 ක් ශීර්ෂ 105 යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වියදම් දැරීම නිසා දැරිය හැකි පරිපාලන වියදම් සීමාව ඉක්මවා රු.2,555,635 ක් වැයකර තිබුණි.

## 3.16 පාඩු හා හානි

----------------

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) අමාත්‍යාංශය විසින් රු.1,014,400 ක් වටිනා ගුවන් යානා පත්‍ර විවිධ අවස්ථාවලදී මිලදී ගෙන තිබූ අතර විවිධ හේතූන් මත එම විදේශ ගමන් අවලංගු කර තිබුණි. අදාල ගෙවීම් කරන ලද යානා පත්‍ර වෙනුවෙන් රු.858,860 ක් වටිනා යානා පත්‍ර හිලව් කර ගෙන තිබුණද ඉතිරි රු.155,540 ක් 2014 දෙසැම්බර් 31 දින වනවිටත් නැවත අයකර නොතිබුණි.

(ආ) 2014 දැයට කිරුළ ජාතික ප්‍රදර්ශණය සහ සංවර්ධන වැඩසටහන් හි ප්‍රගතිය අමාත්‍ය මණ්ඩලයට දැනුවත් කිරීම සඳහා පිටු 36 ක පොත් 150 ක් රු.894,600 ක් වැය කොට පුද්ගලික සමාගමකින් මුද්‍රණය කරගෙන තිබුණි. මෙම එක් පොතක් මුද්‍රණය කිරීමේ පිරිවැය රු.5,964 ක් වූ බැවින් විගණනය විසින් අදාල පොතේ පිරිවිතරයන්ට අනුකූලව මිලගණන් ඉදිරිපත් කරන ලද ආයතනයක්ද ඇතුළුව ආයතන කිහිපයකින් මිලගණන් කැඳවූ අතර එහිදී ඒකක මුද්‍රණ පිරිවැය ලෙස රු.1,400 සිට රු.1,650 පරාසයක වටිනාකම් ඉදිරිපත් විය. වෙළඳපල මුද්‍රණ පිරිවැය පිළිබඳව අනවබෝධයෙන් කටයුතු කිරීම නිසා රජයට රු.600,000 ඉක්මවන අලාභයක් ඇති වී තිබුණි.

(ඇ) හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දිවිනැගුම මූලස්ථානයට අනුබද්ධිත මකුරුප්ප සමෘද්ධි බැංකුව හා මහා සංගමය අතර 2001 අගෝස්තු 09 දින ඇතිකරගත් ගිවිසුමක් අනුව පුද්ගලයන් 05 දෙනෙකුගේ අලෙවි ව්‍යාපෘතියක් වෙත එක් පුද්ගලයකුට රු. ලක්ෂය බැගින් රු. ලක්ෂ 05 ක ණයක් ලබාදී තිබුණි. මේ සඳහා පුද්ගලයන් සමග ගිවිසුමකට එළඹී නොතිබුණු අතර අතර අදාල ණය මුදල 2014 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි.

(ඈ) දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව (සමෘද්ධි අධිකාරිය) විසින් හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට ලබාදී තිබුණු 2011- 2013 වර්ෂයේ සිට පැවැත එන රු.865,658 ක ණය ශේෂයක් සහ ප්‍රජා මූල බැංකු 03 ක් යටතේ 2014 වර්ෂයේදී ලබාදුන් රු.923,621 ක ණය මුදලක්ද අයකර ගෙන නොතිබුණි.

(ඉ) නියෝජ්‍ය අමාත්‍යවරයකු විසින් භාවිතා කරන ලද ජීප් රථය 2013 මැයි 21 දින හදිසි අනතුරකට ලක්වී තිබූ අතර එහි අළුත්වැඩියා කටයුතු සිදු නොකර AMW ආයතනයෙහි ගාල්කර තැබීම නිසා 2013 මැයි 21 දින සිට 2014 නොවැම්බර් 24 දින දක්වා ඒ ආශ්‍රිත වියදම් ලෙස රු.69,320 ක් එම ආයතනයට ගෙවා තිබුණි.

(ඊ) නියෝජ්‍ය අමාත්‍යාතුමා විසින් භාවිතා කරන ලද ජීප් රථය 2013 මැයි 21 දින අනතුරකට පත්වීම නිසා රු.මිලියන 18 ක වෙළඳපොල වටිනාකමක් සහිත එම රථය ගර්හිත තත්ත්වයට පත්ව තිබුණි. පසුව AMW ආයතනය සමඟ නියෝජ්‍ය අමාත්‍යතුමා පවත්වනු ලැබූ සාකච්ඡාවකින් පසුව එම ආයතනයෙන් රථය අළුත්වැඩියා කිරීමට රු.7,729,023 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබූ නමුත් රථයේ රක්ෂණ නියොජිත ආයතනය සමඟ ඇතිවූ නොඑකඟතාවක් මත වර්ෂ 02 කට ආසන්න කාලයක් රථය අළුත්වැඩියා කිරීමක් හෝ පූර්ණ අලාභය මත රක්ෂණ වන්දි ගැනීමක් හෝ සිදුකර නොතිබීම නිසා රජයට පාඩුවක් සිදුවී තිබුණි.

(උ) බදුලු දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හි සංවර්ධන ව්‍යාපෘති සඳහා ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී නිවැරදි රේටයන් හා ප්‍රමාණයන් යොදා නොගැනීමෙන් සාවද්‍ය ගණනය කිරීම් හා ව්‍යාජ පිරිවැය ඇතුළත් කිරීම් නිසා 2014 වර්ෂය තුළ ක්‍රියාත්මක කර තිබූ සංවර්ධන ව්‍යාපෘති 31 ක් සඳහා කොන්ත්‍රාත්කරුවන්ට රු.1,178,117 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඌ) 2014 මාර්තු 05 දින රත්නපුර නව නගර ක්‍රීඩාංගනයේදී පැවැත්වුණු දිස්ත්‍රික් මට්ටමේ දැනුවත් කිරීමේ රැස්වීම සඳහා අවශ්‍ය තහඩු ආවරණය ඇතුළු අනෙකුත් උපකරණ රු.1,323,300 කට රත්නපුර ප්‍රදේශයෙන්ම සපයා ගැනීමට හැකියාව තිබියදීත්, වෙනත් ආයතනයකට රු.1,936,650 ක් ගෙවීම නිසා රු.613,350 ක් අලාභයක් රජයට සිදුව තිබුණි.

(එ) කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ කරච්චෙයි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගව පාලනය දිරිගැන්වීමේ ව්‍යාපෘතියක් ලෙස ගවයකු රු.50,000 බැගින් ගවයන් 206 දෙනෙකු රු.10,300,000 ක් වැය කොට මිලදී ගෙන ප්‍රතිලාභීන් 206 දෙනෙකු අතරේ බෙදාදී තිබුණි. අදාල මිලදී ගැනීම සඳහා සැපයුම්කාර ආයතනය සමඟ ගිවිසුමකට එළඹී නොතිබුණු අතර භෞතික පරීක්ෂාවේදී අදාල ගවයන්ගේ වෙළඳපල වටිනාකම රු.35,000 ක් පමණ බව නිරීක්ෂණය විය. ඒ අනුව ගවයන් 206 දෙනෙකු වෙනුවෙන් රු.3,090,000 ක අධිවැයක් දරා තිබුණි.

(ඒ) කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ කරච්චෙයි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පානීය ජලය ලීටරයක් රු.1.00 බැගින් සපයා දීමේ හැකියාව කරච්චෙයි ප්‍රාදේශීය සභාවට තිබියදීත්, කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පෞද්ගලික ආයතනයක් මගින් ලීටරයක් රු.3.00 බැගින් මිලදී ගෙන තිබුණි. මේ නිසා අවස්ථා 07 කදී ජලය වෙනුවෙන් රු.238,000 ක වැඩිපුර මුදලක් අදාල සැපයුම් කරුවන්ට ගෙවා තිබුණි.

**3.17 අනාර්ථික ගනුදෙනු**

**-----------------------**

නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අරපිරිමැස්මෙන් තොරව එළඹ තිබුණු ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) අමාත්‍යාංශ තොග කළමනාකරණය සඳහා 2012 දෙසැම්බර් 31 දින රු.145,000 කට මිල දී ගන්නා ලද පරිගණක මෘදුකාංග පද්ධතිය මගින් දිස්ත්‍රික්ක සහ ප්‍රාදේශීය මට්ටමින් වත්කම් වාර්තා කිරීම සඳහා එය වැදගත් වන බව දක්වා තිබුණත් දිස්ත්‍රික්ක සහ ප්‍රාදේශීය කාර්යාලවල පිහිටුවා තිබුණු අමාත්‍යාංශ සැලසුම් ඒකකයන්හී ඇති වත්කම් අදාල පද්ධතියට ඇතුළත් කර නොතිබුණි.

(ආ) 2014 වර්ෂයේ සංවර්ධන යෝජනා ක්‍රම සම්බන්ධයෙන් දේශපාලන නියෝජිතයන් සහ රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් 2014 ජනවාරි 13 දින සිට 24 දින දක්වා හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේදී පවත්වා තිබුණි. අදාල

පැමිණීමේ ලේඛන අනුව සහභාගී වූ පුද්ගලයන් සංඛ්‍යාව 4,279 ක් වුවත් සංග්‍රහ කටයුතු වෙනුවෙන් ගෙවීම් කිරීමට ඉදිරිපත් කරන ලද ලේඛන අනුව සහභාගී වූ සංඛ්‍යාව 14, 755 ක් විය. පැමිණීම සහතික නොකළ පුද්ගලයන් 10,476 දෙනෙකු වෙනුවෙන් රු.1,838,688 ක සංග්‍රහ වියදම් කර තිබුණු අතර එය රජයට අමතර වැය බරක් වී තිබුණි.

(ඇ) 2014 ජූනි 09 දින සිට 18 දින දක්වා දකුණු කොරියාවේ පැවති පුහුණු වැඩමුළුව සඳහා එපිටවත්ත ග්‍රාමයේ පදිංචි කම්මල් කර්මාන්තයේ නියැලි පුද්ගලයන් සහභාගී කරවිය යුතු වුවත් එපිටවත්ත ග්‍රාමයේ පදිංචි නොවන කම්මල් කර්මාන්තයේ නියැලී නොසිටින ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් දෙදෙනෙකු සහභාගී කරවා තිබුණි. ව්‍යාපෘතියට පරිබාහිර පුද්ගලයන් උක්ත පුහුණු වැඩමුළුවලට සහභාගී කරවීම මඟින් අදාල කර්මාන්තයේ නියැලී සිටින පුද්ගලයන්ට එම පුහුණු අවස්ථාවන් මඟහැරී තිබුණි.

(ඈ) අමාත්‍යාංශයේ වාහන අනුයුක්ත කරන ලද නිලධාරීන්ට හිමි ඉන්ධන දීමනාව ඉක්මවා අතිරේක ඉන්ධන ලබාගෙන තිබුණි. ධාවන සටහන් සහ ලබාගෙන තිබුණු ඉන්ධන පරීක්ෂාවේදී ධාවනය කළ යුතු දුර ඉක්මවා අතිරේක ඉන්ධන ප්‍රතිපූරණය කර තිබුණි. අතිරේක ලේකම්වරයෙකුට සහ අධ්‍යක්ෂවරයෙකුට ධාවනය කළ යුතු දුර ඉක්මවා පිළිවෙලින් රු.97,814 ක් සහ රු.202,030 ක ඉන්ධන බිල් ප්‍රතිපූරණය කර තිබුණි.

(ඉ) දිවිනැගුම වැඩසටහනට අදාලව වගා කටයුතු පිළිබඳව දැනුවත් කිරීම සඳහා දැනුවත් කිරීමේ පත්‍රිකා 45,882,350 ක් මුද්‍රණය කිරීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් විසින් රජයේ මුද්‍රණාලයාධිපති වෙත ඇණවුම් කර තිබුණද ගෙවීම් වවුචරය ප්‍රකාරව පත්‍රිකා 48,576,150 ක් වෙනුවෙන් රු.53,201,597 ක් රජයේ මුද්‍රණාලයාධිපති වෙත ගෙවා තිබුණි.

(ඊ) අයිතම 16 කට අදාලව මුද්‍රණ පත්‍රිකා 11,775,250 ක් පමණක් අවශ්‍ය වුවත් මුද්‍රණ පත්‍රිකා 14,244,500 මුද්‍රණය කර බෙදාහැර තිබුණි. ඇණවුම් කර නොතිබූ පත්‍රිකා 2,469,250 ක් වෙනුවෙන් වැඩිපුර වැයක් වූ රු.3,073,850 ක් අමාත්‍යාංශය විසින් රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව වෙත ගෙවා තිබුණි.

(උ) කළුතර දිස්ත්‍රික්කයේ පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගොරකාන ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීම සඳහා රු.5,000,000 ඇස්තමේන්තුගත මුදලක් යටතේ කොන්ත්‍රාත් ලබාදී තිබුණි. ක්‍රීඩා පිටිය පිරවීම සඳහා අනුමත වර්ගයේ බොරළුපස් නොයොදා ගොඩනැගිලි කඩා ඉවත් කළ සුන්බුන් ද්‍රව්‍ය යොදා පිරවීම නිසා වැයකරන ලද රු.4,021,734 ක මුදල නිෂ්ඵල වී තිබුණි.

(ඌ) 2014 මාර්තු 10 දින නුවරඑළියේ පැවති දිවිනැගුම උත්සවයේ වේදිකා ඉදිකිරීම සඳහා කොළඹ දිස්ත්‍රික්කයේ ආයතන 4 කින් මිලගණන් කැඳවා රු.2,425,000 ක් වැයකර තිබුණි. ප්‍රදේශය තුළින් මිලගණන් නොකැඳවීම හේතුවෙන් වේදිකා ප්‍රවාහන ගාස්තු ලෙස රු.376,500 ක්ද නුවරඑළිය ප්‍රදේශයට අවශ්‍ය නොවන වායු සමීකරණ සැපයීම වෙනුවෙන් රු.79,000 ක්ද ගෙවා තිබුණි.

(එ) 2014 දැයට කිරුළ ජාතික ප්‍රදර්ශණය සහ සංවර්ධන වැඩසටහන්හි ප්‍රගතියට අදාල ප්‍රගති වාර්තා පොත් මුද්‍රණය කිරීමේදි එම කාර්යය රු.277,200 ක් වූ මුදලකට සිදු කළ හැකිව තිබියදී අදාල ප්‍රසම්පාදන කමිටු හා තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයින්ගේ ඇගයීම් හා තීරණ ගැනිමේ දුර්වලතාවයන් නිසා ඒ4 ප්‍රමාණයේ පිටු 32 ක් සහිත එක් පොතකට රු.5,960 බැගින් පොත් 150 ක් සඳහා රු.894,000 වැයකර අරපිරිමැස්මෙන් තොර ගනුදෙනුවක් සිදුකර තිබුණි.

(ඒ) මාතර දිස්ත්‍රික්කයේ තරුණ තරුණියන්ට රියදුරු පුහුනුව ලබාදිම සඳහා 2014 වර්ෂයේදී රු.3,387,900 ක් ප්‍රතිපාදන සලසා තිබු අතර ඒ සඳහා ප්‍රතිලාභීන් 491 දෙනෙකු තෝරාගෙන ලිඛිත විභාගය සඳහා අත්තිකාරම් වශයෙන් රු.1,693,950 ක් ගෙවා තිබුණි. ඉතිරි රු.1,693,950 2015 මැයි 15 දින වන විටද මුදල් රෙගුලාසි 136 සහ 137 ට පටහැනි ලෙස පොදු තැන්පත් ගිණුමේ තැන්පත් කර තිබුණි. රියදුරු පුහුනුව සඳහා අදාල ආයතනයට මුදල් ගෙවිය යුතු වන්නේ ලිඛිත

විභාගය සමත් වීමෙන් පසුව වුවද විභාගයට නොපැමිණි 36 දෙනෙකු හා විභාගය අසමත්ව තිබූ 42 ක් වෙනුවෙන්ද රු.269,100 ක් රියදුරු පුහුණු ආයතනයට ගෙවා තිබුණි.

(ඔ) මාතර දිස්ත්‍රික්කයේ සුළු අපනයන භෝග වැඩිදියුණු කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 ක් තුළ කුරුඳු පැල 1,637,030 ක් බෙදාහැර තිබූ අතර පැළ ප්‍රවාහනය සඳහා රු.6,548,120 ක මුදලක් ප්‍රවාහනකරුට ගෙවා තිබුණි. පැළ බෙදාහැරීම සඳහා සැපයුම්කරුවන් තෝරා ගැනීමේදී අවශ්‍ය පිරිවිතර දක්වා නොතිබූ අතර ප්‍රාදේශීය ලේකම් කාර්යාල ආසන්නයේ සැපයුම්කරුවන් තෝරා නොගැනීම නිසා එක් පැලයකට රු.4.00 බැගින් සෑම ස්ථානයකටම පැල බෙදා හැරීම සඳහා සමාන පිරිවැයක් දරා තිබුණි.

## 3.18 විසඳා නොතිබුණු විගණන ඡේද

---

අමාත්‍යාංශයට අදාලව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| වර්ෂය | ඡේද අංකය | |
| 2011<br>2012<br>2013<br>2014 | එල්පී/එෆ්/එම්ඊඩී/අත්.ගි./2011<br>එම්ඊඩී/ර.නි.අ.ගි./ඒක්‍යු/18<br>වයිඑස්/සී/එම්ඊඩී/ර.නි.අ.ගි./2013<br>වයිඑස්/සී/එම්ඊඩී/ර.නි.අ.ගි./2014 | • විදේශ නිවාඩු ලබා විදේශගත වූ නිලධාරීන් දෙදෙනෙකුට ලබා දෙන ලද රු.1,076,581 ක් වූ ආපදා හා දේපල ණය සහ ඊට අදාල පොලිය අයකර නොගැනීම.<br>• එම දේපල ණය ගෙවන ලද දේපලට අදාල ඇටෝර්නි බලය පවරා නොගැනීම<br>• නිලධාරීන් විදේශගත කාලය තුලදී ගෙවන ලද වැටුප, විදේශ පුහුණුවට දරන ලද වියදම සහ අනිවාර්ය සේවා කාලය සේවය නොකිරීම නිසා ගෙවිය යුතු දණ්ඩන මුදල වන රු.2,342,630 ක් අයකර නොගැනීම.<br>• ණය නිදහස්කර ඇති බලධාරීන්ට විරුද්ධව විනයානුකූලව කටයුතු නොකිරීම |
| 2011<br>2012<br>2013<br>2014 | එල්පී/එෆ්/එම්ඊඩී/අත්.ගි./2011<br>එම්ඊඩී/ර.නි.අ.ගි./ඒක්‍යු/18<br>වයිඑස්/සී/එම්ඊඩී/ර.නි.අ.ගි./2013<br>වයිඑස්/සී/එම්ඊඩී/ර.නි.අ.ගි./2014 | ව්‍යාජ පත්වීමක් මත රාජ්‍ය සේවයට පැමිණි නිලධාරීයෙකුගේ රු.109,650 ක් වූ ණය ශේෂය අයකර නොගැනීම |
| 2011<br>2012<br>2013<br>2014 | එල්පී/එෆ්/එම්ඊඩී/අත්.ගි./2011<br>එම්ඊඩී/ර.නි.අ.ගි./ඒක්‍යු/18<br>වයිඑස්/සී/එම්ඊඩී/ර.නි.අ.ගි./2013<br>වයිඑස්/සී/එම්ඊඩී/ර.නි.අ.ගි./2014 | නිලධාරියකු විසින් ලබාගත් දේපල ණය මුදල අදාල කාර්යය සඳහා නොයෙදවීම නිසා රු.332,331 ක් වූ ණය ශේෂය මරණ පාරිතෝෂිකයෙන් හෝ අයකර නොගැනීම |
| 2012<br>2013<br>2014 | එම්ඊඩී/ර.නි.අ.ගි./ඒක්‍යු/18<br>වයිඑස්/සී/එම්ඊඩී/ර.නි.අ.ගි./2013<br>වයිඑස්/සී/එම්ඊඩී/ර.නි.අ.ගි./2014 | වැඩ තහනමට ලක්වූ නිලධාරියකුගේ විශ්‍රාම පාරිතෝෂිකයද අහිමිකර ඇති බැවින් රු.64,314 ක් වූ ණය ශේෂය අයකර ගැනිමට නොහැකි වීම |

| | | |
|---|---|---|
| 2012<br>2013<br>2014 | එම්ර්ඩී/ර.නි.අ.ගි./ඒකපු/18<br>වයිඑස්/සී/එම්ර්ඩී/ර.නි.අ.ගි./2013<br>වයිඑස්/සී/එම්ර්ඩී/ර.නි.අ.ගි./2014 | අනුමැතියකින් තොරව කිලිනොච්චිය සහ මුලතිව් යන දිස්ත්‍රික් ලේකම් කාර්යාල දෙකෙහි නිලධාරීන් 19 දෙනෙකුට ලබාදුන් රු.4,075,159 කට අධික වූ වසර දෙකක වැටුප් ණය අදාල ණය ලාභීන්ගෙන් එකවර අයකර නොගැනීම. |
| 2013 | 1.6(v) | සියයට 5 සහ සියයට 15 බැගින් වූ විශේෂ දීමනාව, රාජකාරී ආවරණය කිරීමේ පදනම මත විදේශාධාර ව්‍යාපෘතීන්හී සේවය කරන නිලධාරීන්ට ලබාගත නොහැකි වුවත් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන නියැදි පරීක්ෂණයට ලක් කරන ලද විදේශාධාර ව්‍යාපෘති 03 ක නිලධාරීන් 79 දෙනෙකු සඳහා 2011 වර්ෂයේ සිට 2014 සැප්තැම්බර් මාසය දක්වා කාලය සඳහා එම විශේෂ දීමනාව ලෙස රු.3,132,075 ක් ඔවුන්ගේ පාරිශ්‍රමිකය සමඟ ගෙවා තිබුණි. එම සාවද්‍ය ගෙවීම් සිදුකරන ලද නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කර නොතිබුණි |
| 2013 | 1.6(iv) | චක්‍රලේඛ උපදෙස්වලට අනුකූල නොවන ලෙස අමාත්‍යාංශයේ නිලධාරීන් 65 දෙනෙකු සඳහා 2013 ජනවාරි සිට 2014 සැප්තැම්බර් දක්වා දුරකථන බිල්පත් රු.2,094,018 ක් ප්‍රතිපූර්ණය කර තිබුණි. |
| 2013 | 1.6(iv) | අත්‍යාවශ්‍ය වාහන අවශ්‍යතාවයක් සපුරා ගැනීම සඳහා නිශ්චිත කාල පරිච්ඡේදයක් සඳහා වාහන බදු කුලියට ලබාගැනීමේදී මාසිකව එක් වාහනයකට බදුකුලිය ලෙස ගෙවිය හැකි උපරිමය රු.40,000 ක් වුවත් අමාත්‍යාංශය විසින් රු.150,000 බැගින් වාහනයක් කුලියට ගෙන 2013 පෙබරවාරි 20 දින සිට දෙසැම්බර් 26 දක්වා කාලය සඳහා කුලී වශයෙන් රු.1,057,334 ක් වැඩිපුර ගෙවා තිබුණි. |

## 3.19 කළමනාකරණ දුර්වලතා

-----------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

**(අ)** දිවිනැගුම ජීවනෝපාය හා දොරින් දොරට ගමින් ගමට සංවර්ධන වැඩසටහන් 2014 යටතේ නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පුද්ගලයන් 184 කගේ රු.4,052,137 ක් වටිනා ව්‍යාපෘති 18 ක් ක්‍රියාවට නැංවීමට හඳුනාගෙන තිබුණද 2015 ඔක්තෝබර් 20 දක්වා අදාල මුදල් දිවිනැගුම ප්‍රජා මූල බැංකුවල රඳවාගෙන තිබුණි.

(ආ) දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව ආරම්භ කිරීමේදී ඒකාබද්ධ කළ සමෘද්ධි අධිකාරිය, දක්ෂිණ සංවර්ධන අධිකාරිය සහ උඩරට සංවර්ධන අධිකාරිය යන ආයතන තුනෙහි සේවයේ නියුක්තව සිට ස්ව කැමැත්තෙන් සේවයෙන් ඉවත්වූ දිස්ත්‍රික්ක 23 ක නිලධාරීන් 826 දෙනෙකුට 2014 දෙසැම්බර් 31 දින වන විට වන්දි හා පාරිතෝෂික මුදල් වශයෙන් රු.833,237,615 ක් එම දිස්ත්‍රික්කයන්හී දිවිනැගුම ප්‍රජාමූල බැංකු සමිතිවල අරමුදල් උපයෝගී කරගෙන ගෙවා තිබුණි. දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් එම මුදල් දිවිනැගුම ප්‍රජාමූල සමිති වෙත ප්‍රතිපූරණය

කරනු ලබන බවට දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් දෙන ලද ලිඛිත තහවුරුව අනුව මෙම මුදල් එම බැංකු අරමුදල් මගින් ගෙවා තිබුණත් 2015 ඔක්තෝබර් මාසය වන විටද එම මුදල ප්‍රතිපූර්ණය කර නොතිබුණි. එසේම, මෙම ගෙවීම් සඳහා දිවිනැගුම ප්‍රජාමූල බැංකු සමිති සතු ස්ථාවර තැන්පතු උපයෝගී කර ගැනීම නිසා එම බැංකුවලට පොලී මුදල් අහිමි වීමක්ද සිදු වී තිබුණි.

(ඇ) හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 2014 වර්ෂය තුළ සමෘද්ධි ලාභීන්ගේ ඉතුරුම් තැන්පතු වෙනුවෙන් ගෙවන ලද පොලී මුදල් සමෘද්ධි අධිකාරියෙන් ප්‍රතිපූරණය කරවා ගත යුතු වුවත් එසේ ගෙවන ලද පොලී මුදලෙන් රු.1,682,203 ක් ප්‍රතිපූරණය කරගෙන නොතිබුණි.

(ඈ) සමෘද්ධි අධිකාරියේ බැංකු සංගම් මෙහෙයුම් චක්‍රලේඛ ලිපි අංක 24 අනුව දිරියමාතා ගිණුම් ආරම්භ කිරීමෙන් අපේක්ෂිත අරමුණු හා ඉලක්ක සපුරාගත යුතු වුවත් හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පැවැති දිරියමාතා ගිණුමේ රු.2,514,911 ක මුදලක් 2015 මාර්තු 31 දින වන විටත් අක්‍රියව පැවතුණි.

(ඉ) හඟුරන්කෙත ප්‍රජා මූල බැංකු 10 ක රු.18,821,457 ක් වටිනා කොටස් මුදල් හා තැන්පත් 2015 ඔක්තෝබර් 20 දිනවන විටත් අක්‍රියව පැවතුණි.

(ඊ) දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අංක 2014/11 හා 2014 ඔක්තොබර් 30 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව "ඉසුරුමත් නිවහනක්" තේමාව යටතේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 05 ක දිවිනැගුම සහනාධාර ලාභීන් 25,883 දෙනෙකු වෙත දිවිනැගුම ප්‍රජා මූල බැංකු සංගම්වල සහනාධාර ලාභීන්ගේ ඉතුරුම් මගින් ගෙවන ලද රු.64,707,500 මුදලක් 2015 ජනවාරි 30 වන විටත් ප්‍රතිපූර්ණය කර ගෙන නොතිබුණු අතර තවත් සහනාධාරලාභින් 12,022 ක් සඳහා ගෙවිය යුතු රු.30,055,000 ක්ද ගෙවීමට කටයුතු කර නොතිබුණි.

## 3.20 මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

**චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවූ පත් කිරීම්**

-------------------------------------------------

පහත දැක්වෙන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවූ පත් කිරීම් නිරීක්ෂණය විය.

(අ) 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයෙහි විධිවිධාන අනුව රජයේ සේවයේත්, පළාත් පාලන ආයතන ඇතුළත්ව පළාත් රාජ්‍ය සේවයේත්, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවලින් පූර්ණ කාලීනව ව්‍යාපෘති සඳහා නිදහස් කරන නිලධාරීන්ගේ සේවා කාලය වසර 05 ඉක්ම නොවිය යුතු වුවත්, අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ "ලෝක ආහාර වැඩසටහන" ව්‍යාපෘතියේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකයෙහි රාජකාරි සඳහා රජයේ සේවයෙන් පූර්ණකාලීනව නිදහස් කරන ලද නිලධාරීන් 12 දෙනෙකු වසර 05 ඉක්මවා සේවය කර තිබූ අතර ඒ සඳහා මූලික වැටුපෙන් සියයට 50 ක් ලෙස ගණනය කරන ලද දීමනාවක්ද ගෙවා තිබුණි.

(ආ) 2007 අප්‍රේල් 05 දිනැති හා අංක 33 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයෙහි විධිවිධාන අනුව ව්‍යාපෘතියකට කොන්ත්‍රාත් පදනමින් බඳවා ගන්නා නිලධාරීන්ගේ සේවා කාලය උපරිම වශයෙන් වසර 03 ක් විය යුතු වුවත් "ලෝක ආහාර වැඩසටහන" ව්‍යාපෘතියේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සඳහා නිලධාරීන් 06 දෙනෙකුද ඔරුගොඩවත්ත ගබඩා සංකීර්ණයෙහි නිලධාරීන් 15 දෙනෙකුද වසර 03 ඉක්මවා කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා තිබුණි.

(ඇ) 2007 අප්‍රේල් 05 දිනැති හා අංක 33 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයෙහි ව්‍යාපෘති තනතුරු කාණ්ඩගත කර ඇති අතර ඒ සෑම කාණ්ඩයක් සඳහාම බඳවාගත යුතු නිලධාරීන් සතුව තිබිය යුතු අවම සුදුසුකම දක්වා ඇත. එසේ වුවත් ''ලෝක ආහාර වැඩසටහන'' ව්‍යාපෘතියේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකයෙහි පූර්ණ කාලීන සේවය සඳහා බඳවා ගනු ලැබූ සහකාර ව්‍යාපෘති අධ්‍යක්ෂ තනතුරෙහි නිලධාරීන් දෙදෙනෙකු හට චක්‍රලේඛයෙන් දක්වා තිබූ අවම සුදුසුකම හා පළපුරුද්දද නොතිබුණි.

## 4. ශීර්ෂය 218 - සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

---

### 4.1 ගිණුම් ඉදිරිපත් කිරීම

---

දෙපාර්තමේන්තුව විසින් 2015 මාර්තු 31 දින වන විට ශීර්ෂ 218 දරන විසර්ජන ගිණුම විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත්, එම ගිණුම් දින 21 කට වැඩි කාල පමාවකින් පසුව 2015 අප්‍රේල් 21 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. විෂය අංක 21801 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය 2015 අප්‍රේල් 30 දින වන විට විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත් එය 2015 ජුනි 15 දින විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 4.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

---

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසි | නිරීක්ෂණ |
|---|---|---|---|
| (i) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා නොතිබුණි. |
| (ii) | ඉන්වෙන්ට්‍රි ලේඛනය, | මුදල් රෙගුලාසි 454(1) ප්‍රකාරව | පවත්වා නොතිබුණි. |
| (iii) | තොග ලේඛනය | මුදල් රෙගුලාසි 751 හා 763 ප්‍රකාරව | පවත්වා නොතිබුණි. |
| (iv) | පරිගණක හා පරිගණක උපාංග ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක 1A1/2002/02- දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා නොතිබුණි. |
| (v) | වාහන ලේඛනය | මුදල් රෙගුලාසි 802 සහ මුදල් රෙගුලාසි 1647 (ඉ) ප්‍රකාරව | යවත්කාලින කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (vi) | ලැබෙන චෙක්පත් , මුදල් ඇනවුම් සඳහා වූ ලේඛනය | මුදල් රෙගුලාසි 451 | පවත්වා නොතිබුණි. |
| (vii) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891 (1) | පවත්වා නොතිබුණි |
| (viii) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454 (2) | පවත්වා නොතිබුණි |
| (ix) | ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණ ඇගයීම් කමිටුවල පැමිණීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය | පවත්වා නොතිබුණි |
| (x) | කමිටු රැස්වීම් වාර්තා | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.3 (අ) මාර්ගෝපදේශය | පවත්වා නොතිබුණි |
| (xi) | ලංසු කැඳවීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2.1 මාර්ගෝපදේශය | පවත්වා නොතිබුණි |

**4.3 විගණන විමසුම්වලට පිළිතුරුදීම**

**------------------------------------**

දෙපාර්තමේන්තුව වෙත සමාලෝචිත වර්ෂයේදී නිකුත් කරන ලද විගණන විමසුම් 2 කට සහ ඉකුත් වර්ෂවලදී නිකුත් කළ විගණන විමසුම් 4 කට 2015 මාර්තු 31 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. එම විමසුම්වලට අදාල ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.46,051,770 ක් වී තිබුණි.

**4.4 විසර්ජන ගිණුම**

**-----------------**

**4.4.1 අයවැය විචලනය**

**--------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 09 ක් සඳහා සළසා තිබුණු රු.4,800,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ආ) වැය විෂයයන් 6 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ

ප්‍රතිපාදනයෙන් සියයට 10 ක සිට සියයට 87 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ඈ) 2014 දෙසැම්බර් 01 දිනැති අංක 239/2014 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 5 ඡේදය ප්‍රකාරව වැය විෂයයන් 15 ක එකතුව රු.8,560,000 ක ඉතිරිවීම් සම්බන්ධයෙන් දක්වා තිබුණු හේතු ප්‍රමාණවත් වී නොතිබුණි. ඒ අනුව සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ පරිපාලන හා මූල්‍ය කටයුතු දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවට අන්තර්ග්‍රහනය කිරීම හේතුවෙන් මෙම ඉතිරිවීම් පැනනැගී තිබුණු බව සඳහන් කර තිබුණද, මේ සම්බන්ධයෙන් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්ගේ 2014 ජනවාරි 21 දිනැති අංක බීඩී /ආර්ඩීඑස්331/1/6 දරන ලිපියේ උපදෙස් ප්‍රකාරව සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව හා දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවට අන්තර්ග්‍රහනය කළ අනෙකුත් ආයතනවලට අදාලව වෙන්කළ ප්‍රතිපාදනවලින් පුනරාවර්තන හා ප්‍රග්ධන වැය දැරීමට අපේක්ෂිත වැය විෂයයන් පිළිබඳ විස්තර ජාතික අයවැය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතු බව දන්වා තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

## 4.5 පොදු තැන්පත් ගිණුම

----------------------

වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු.2,454,220,181 ක්වූ තැන්පතු ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 4.6 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

-----------------------------------------

### 4.6.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

---------------------------- ---

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්ම 2014 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 4.6.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

--------------------------------

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2014 දෙසැම්බර් 30 දින අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතියට ඉදිරිපත් කර තිබුණි.

## 4.6.3 අභ්‍යන්තර විගණනය

මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.

## 4.6.4 විගණන හා කළමනාකරණ කමිටුව

2014 වර්ෂයේ දී විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් වාර 03 ක් පවත්වා තිබුණි.

## 4.7 වත්කම් කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

### (අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2014 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2015 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් 2015 මැයි 31 දින වන විටත් එම වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. අවසාන වශයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2013 වර්ෂය වෙනුවෙන් පවත්වා තිබුණි.

### (ආ) බාහිර පාර්ශවයන් වෙත ලබාදී ඇති වත්කම්

දෙපාර්තමේන්තුව විසින් ඇතැම් වත්කම් අවිධිමත් ලෙස බාහිර පාර්ශවයන් වෙත මුදාහැර තිබුණු අවස්ථා නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| වත්කම් වර්ගය | වත්කම් සංඛ්‍යාව | වත්කම් ලබාදී ඇති ආයතනය | වටිනාකම | කාල පරිච්ඡේදය |
|---|---|---|---|---|
| | | | රු. | |
| (i) මෝටර් වාහන | 01 | උද්භිද උද්‍යාන හා පොදු විනෝදාත්මක කටයුතු පිළිබඳ අමාත්‍යාංශය | තක්සේරු කර නොතිබුණි | 2014.04.17 සිට |
| (ii) මෝටර් වාහන | 03 | ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව | තක්සේරු කර නොතිබුණි | 2014.03.31 සිට |
| (iii) මෝටර් වාහන | 01 | විදුලි සංදේශ හා | තක්සේරු කර | - |

තොරතුරු තාක්ෂණිකනොතිබුණි
අමාත්‍යාංශයට
තාවකාලිකව භාර දී ඇත

**(ඇ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

**-----------------------------------------------------------------**

වෙනත් ආයතන සතුව තිබුණු ඇතැම් වත්කම් විධිමත් අනුමැතියකින් තොරව දෙපාර්තමේන්තුව විසින් භාවිතයට ගෙන තිබුණු අවස්ථා නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| වත්කම් වර්ගය | වත්කම් අයත්ව තිබුණු ආයතනය | සංඛ්‍යාව | වටිනාකම |
|---|---|---|---|
| මෝටර් වාහන | නාගරික සංවර්ධන අමාත්‍යාංශය | 01 | රු. තක්සේරු කර නොතිබුණි |

**(ඈ) බේරුම් නොකළ බැරකම්**

**----------------------------**

දෙපාර්තමේන්තුව විසින් 2014 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ වර්ෂ 01 කට වඩා අඩු බැරකම් රු.5,925,155 ක් විය.

## 4.8 අනුකූල නොවීම්

**-----------------**

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

**---------------------------------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීතී, රීතී හා රෙගුලාසිවලට යොමුව | | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | |
| (i) | XII පරිච්ඡේදයේ 1.7 වගන්තිය | - | නිලධාරින්ගේ නිවාඩු සටහන් කිරීම සඳහා 190 පොදු ආකෘතියේ නිවාඩු ලේඛනයක් පවත්වා ගත යුතු වුවත්, ප්‍රාදේශිය කාර්යාල කිහිපයක නිවාඩු ලේඛනය පවත්වා නොතිබුණි. |
| (ii) | XII පරිච්ඡේදය 1 හා 2 වගන්ති | - | රාජකාරි දිනවලදී සේවයට නොපැමිණෙන නිලධාරින් විසින් තම අධීක්ෂණ නිලධාරියා ලවා රාජකාරි හෝ පෞද්ගලික නිවාඩු අනුමත කර ගැනීම සිදු කළ යුතු වුවත්, එවැනි අනුමැතියකින් තොරව සේවයට වාර්තා කර නොතිබුණි. |
| (iii) | XII පරිච්ඡේදයේ 3.2 වගන්තිය | - | කාර්ය ස්ථානයෙන් බැහැර යෑමේදී බැහැරයාමේ ලේඛනයේ සටහන් කර අදාල අධික්ෂණ නිලධාරියා මඟින් අනුමත කරවා ගතයුතු වුවත්, එසේ කර නොතිබුණු අවස්ථා විය. |
| (iv) | XXIV පරිච්ඡේදයේ 4,5හා 4,6 වගන්තිය | 191,402 | සේවය හැර ගිය හා වැඩ තහනමට ලක් වූ නිලධාරින්ගේ හිඟ ණය ශේෂ සම්බන්ධයෙන් විධිවිධාන ප්‍රකාරව ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට හෝ නීතිපති උපදෙස් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි |

**(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**

**------------------------------**

| | | |
|---|---|---|
| මුදල් රෙගුලාසි 110 | - | විධිමත් පරිදි හානි ලේඛන පවත්වා නොතිබුණි. |

**(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

**----------------------------**

| | | |
|---|---|---|
| 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛය | - | සෑම මාස 06 කට වරක් දෙපාර්තමේන්තුවේ සියළු වාහනවල ඉන්ධන දහනය පරික්ෂා කර නොතිබුණි. |

**(ඈ) ජාතික අයවැය චක්‍රලේඛ**

**----------------------------**

| | | |
|---|---|---|
| 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන චක්‍රලේඛයේ 1.1.7 ඡේදය | 346,092<br>646,682 | යම් නිලධාරියෙකු ස්ථාන මාරුවී මාස 03 ක් සහ ස්ථාන මාරු වී පැමිණි මාස 02 ක් ඉක්මවීමට පෙර ණය ශේෂ නිරවුල් කර ගත යුතු වුවත්, ස්ථාන මාරුවී ගිය නිලධාරින් 04 දෙනෙකුගේ එකතුව රු.346,092ක් සහ ස්ථාන මාරු ලැබ පැමිණි නිලධාරින් 04 දෙනෙකුගේ එකතුව රු.646,682 ක් වු ණය ශේෂ 2014 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි. |

**(ඉ) සමෘද්ධි දිමනා චක්‍රලේඛ**

**----------------------------**

2013 ජනවාරි 10 දිනැති අංක 2013/ 01 දරන චක්‍රලේඛයේ

| | | |
|---|---|---|
| (i) 2.1( ii) ඡේදය | 5,074,810 | සෑම මසකම රු.10 ක මුදලක් අඩුකර අදාල මාසයේ 20 වෙනි දිනට ප්‍රථම නිවාස ලොතරැයි අරමුදල වෙත ප්‍රේෂණය කළ යුතු |

| | | | |
|---|---|---|---|
| | | | වුවද, නියැදි පරික්ෂාවට අනුව එක් ප්‍රාදේශිය ලේකම් කාර්යාලයක් මාස 2 කට වඩා ප්‍රමාදකර ප්‍රේෂණ කර තිබුණි. |
| (ii) | 2.1 iii , iv සහ 5.3 ඡේද | 18,160,555 | සෑම මසකම අදාල අනිවාර්ය ඉතිරිකිරීම් හා ප්‍රතිලාභීන්ට ගෙවිය යුතු මුදල එකවර ප්‍රතිලාභීන්ගේ ගිණුම්වලට බැරකළ යුතු වුවත්, බැංකු සංගම් 03 ක් විසින් දින 03 ක සිට දින 14 ක් දක්වා කාල ප්‍රමාදයකින් පසු එම මුදල් බැර කර තිබුණි |
| (iii) | 4.2 ඡේදය | 15,065,190 | සමෘද්ධි සහනාධාරවලට අදාල චෙක්පත් සමෘද්ධි බැංකු සංගම් වෙත සෑම මසකම 25 දිනට පෙර යැවිය යුතු වුවත්, දින 02 ක සිට දින 48 ක් දක්වා කාල ප්‍රමාදයකින් පසු එම චෙක්පත් යවා තිබුණි. |

## 4.9 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

-----------------------------------

දෙපාර්තමේන්තුව විසින් සිදුකර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ එවැනි ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) සමෘද්ධි ප්‍රතිලාභින්ට ලබාදෙනු ලබන සහනාධාර මුදල් අදාල බැංකු ගිණුම්වලට බැර කිරීමේදී අදාල වසම් භාර ග්‍රාම නිලධාරින් මඟින් ප්‍රාදේශීය ලේකම් වෙත දැන්වීමේ ප්‍රමාදයන් හේතුවෙන් නියැදි පරික්ෂාවට ලක්කළ බැංකු සංගම් 4 ක ප්‍රතිලාභින් 7ක් මිය ගොස් තිබියදීත් ප්‍රතිලාභීන්ගේ ගිණුම්වලට රු.63,000 ක මුදලක් බැරකර තිබුණි.

(ආ) වැඩිහිටි නිවාසවල ජීවත්ව සිටින ප්‍රතිලාභීන්ට ඔවුන්ගේ අවශ්‍යතා සඳහා උපයෝගී කර ගැනීමට, අදාල වැඩිහිටි නිවාසයේ පාලිකාවගේ නමින් විවෘත කළ ගිණුමකට බැරකර තිබුණු රු.326,187ක් දිගු කලක් තිස්සේ ප්‍රයෝජනයට නොගෙන තිබු අතර, බොහෝ ප්‍රතිලාභීන් ඒ වන විටත් මියගොස් තිබුණි.

**4.10 අවිධිමත් ගනුදෙනු**

**-----------------------**

**අධිකාර බලය නොමැති වූ ගනුදෙනු**

**-----------------------------------------**

ප්‍රතිලාභින් හඳුනා ගැනීමට නොහැකිවීම් මත ඉතිරිවන මුදල් වේනම් එය මහා භාණ්ඩාගාරය වෙත යැවිය යුතු වුවත්, සමෘද්ධි අධ්‍යක්ෂ ජනරාල්ගේ හෝ සමෘද්ධි කොමසාරිස් ජනරාල්වරයාගේ කිසිදු අනුමැතියකින් තොරව බැංකු සංගමයක පැවති බොල් ණය රු.390,600 ක් කපාහැරීම සඳහා එම මුදල් යොදා ගෙන තිබුණි.

**4.11 මානව සම්පත් කළමනාකරණය**

**------------------------------------**

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

**----------------------------------------------------**

සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව හා ග්‍රාම සංවර්ධන පර්යේෂණ ආයතනය දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව ස්ථාපිත කිරීමේදී එයට ඒකාබද්ධ කිරීම නිසා 2014 දෙසැම්බර් 31 දින වන විට සංවිධාන ව්‍යුහය හා කාර්ය මණ්ඩලයද දිවිනැගුම දෙපාර්තමේන්තුවට ඒකාබද්ධ කර ඇති බව දන්වා තිබුණි.

**5. ශීර්ෂ 281 - ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව**

**---------------------------------------------------**

**5.1 ගිණුම් ඉදිරිපත් කිරීම**

**------------------------**

දෙපාර්තමේන්තුව විසින් 2015 මාර්තු 31 දින වනවිට පහත සඳහන් ගොවිජන සේවා මධ්‍යස්ථානවල ගිණුම් විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත්, එම ගිණුම් 2015 ජූනි 25 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| වර්ෂය | ඉදිරිපත් නොකළ ගිණුම් සංඛ්‍යාව |
|---|---|
| 2006 | 27 |
| 2007 | 28 |
| 2008 | 28 |
| 2009 | 47 |
| 2010 | 41 |
| 2011 | 35 |
| 2012 | 57 |
| 2013 | 82 |
| 2014 | 270 |

**5.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තු විසින් පහත දැක්වෙන ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|
| හානි හා පාඩු | මුදල් රෙගුලාසි 110 | යාවත්කාලීන කර නොතිබුණි. |
| ස්ථාවර වත්කම් | මුදල් රෙගුලාසි 502(2) | පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| උප පත්‍රිකා පොත් | මුදල් රෙගුලාසි 341(1) | යාවත්කාලීන කර නොතිබුණි. |

**5.3 විසර්ජන ගිණුම**

**5.3.1 අයවැය විචලනය**

වැය විෂයයන් 08 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 ක සිට සියයට 62 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**5.4 පොදු තැන්පත් ගිණුම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අංක 6000/0000/00/0006/0051/000 හා අංක 6000/0000/00/0015/0136/000 දරන පොදු තැන්පත් ගිණුම්වල ශේෂයයන් දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර පොත් අනුව පිළිවෙලින් රු.651,767 කින් හා රු.489,597 කින් නොසැසදුණි. එම වෙනස්කම් 2014 දෙසැම්බර් 31 දින වන විටත් සසඳා නිවැරදි කර නොතිබුණි.

(ආ) අංක 6000/0000/00/0015/0136/000 හා අංක 6000/0000/00/0002/0010/000 දරන පොදු තැන්පත් ගිණුම්වල සමාලෝචිත වර්ෂය අවසානයට පැවති වර්ෂ 2 ඉක්ම වූ නිරවුල්කර නොතිබුණු පිළිවෙලින් රු.304,009 ක් හා රු.17,500 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**5.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 28101 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරීක්ෂාවේදි පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.21,464,717 ක්වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 සිට වර්ෂ 05 දක්වා කාල පරාසයක් ගත වී තිබුණත් එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ආ) ක්ෂේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව පාලන ගිණුමේ ශේෂය සමඟ සැසඳීමේදී රු.1,482,667 ක වෙනසක් නිරික්ෂණය වූ අතර, මෙම වෙනස තුළ 2007 දෙසැම්බර් 31 දිනට ක්ෂේවල ශේෂ සාරාංශයන්ගේ වෙනස වූ රු.364,515 ක්ද, හඳුනා නොගත් හර ශේෂය රු.1,986,920 ක්ද, හඳුනා නොගත් බැර ශේෂය රු.868,768 ක්ද අන්තර්ගත වී තිබුණු බව තවදුරටත් නිරික්ෂණය විය.

(ඇ) ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 4 වැනි වගන්තිය ප්‍රකාර කටයුතු නොකළ විශ්‍රාම ගිය, වැඩ තහනම් කළ සහ සේවය අවසන් කළ නිලධාරින්ගේ 2014 දෙසැම්බර් 31 දිනට ණය ශේෂවල එකතුව රු.16,631,406 ක් වු අතර, එම ශේෂය තුළ වර්ෂ 5 ට වඩා වැඩි රු.5,960,267 ක ණය ශේෂ පැවති බවද නිරික්ෂණය විය.

(ඈ) ප්‍රාදේශිය සභාවලට තරඟ කොට තේරි පත් වු මන්ත්‍රීවරු තිදෙනෙකුගෙන් අයවිය යුතු රු.30,740 ක ණය ශේෂයක් අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

(ඉ) පළාත් සභා නිලධාරින් ලෙස අන්තර්ග්‍රහණය කළ ගොවිජන සේවා නිලධාරින්ගෙන් අයවිය යුතු රු.486,944 ක ණය ශේෂ වර්ෂ 6 කට වඩා වැඩි කාලයක සිට පැවත එන අතර එම ශේෂය නිරවුල් කිරිමට කටයුතු කර නොතිබුණි.

(ඊ) ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගෙන් හා ස්ථාන මාරු වි පැමිණි නිලධාරින්ගේ ණය ශේෂ පිළිවෙලින් රු.3,415,748 ක් හා රු.20,273 ක් වී තිබුණි. ස්ථානමාරුවීම් ලබා ගිය නිලධාරීක්ගේ ණය ශේෂ වර්ෂ 06 කට වැඩි කාලයක සිට පැවැත එමින් තිබුණි. එම ශේෂ සම්බන්ධයෙන් 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර 2014 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කිරිමට අපොහොසත් වී තිබුණි.

(උ) 2007, 2008 හා 2009 යන වර්ෂවල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශවල දක්වා තිබු හඳුනා නොගත් රු.374,380 ක ණයගැති ශේෂයක් හඳුනා ගැනිමකින් තොරව රාජ්‍ය ආදායමට බැර කර තිබුණි.

**5.6 යහපාලනය හා ගිණුම්කටයුතුභාවය**

**5.6.1 වත්කම් කළමනාකරණය**

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්**

පහත වර්ග කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රියව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

(i) දෙපාර්තමේන්තුව සතුව නිල නිවාස 155 ක් පවතින අතර, එයින් කුලියට දි ඇති නිල නිවාස ප්‍රමාණය 51 ක්ද, අබලන් නිවාස ප්‍රමාණය 89 ක්ද, කුලියට දී නොමැති නිවාස 15 ක්ද පැවැතුණි.

(ii) අනුරාධපුර, හම්බන්තොට හා මොණරාගල දිස්ත්‍රික්ක තුනට අයත් ඩෝසර් යන්ත්‍ර 12 ක් වර්ෂය පුරාම ධාවනය නොකර නිෂ්කාර්යයව පැවතුණි. තවද, අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඩෝසර් යන්ත්‍රයක් සමාලෝචිත වර්ෂය තුළ පැය 5 කටත් වඩා අඩු කාලයක් ද මොණරාගල දිස්ත්‍රික්කයේ ඩෝසර් යන්ත්‍රයක් පැය 72 ක කාලයක් පමණක්ද සේවයේ යොදවා තිබුණි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

**------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මුදල් රෙගුලාසි 757(2) ප්‍රකාරව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තා විගණනය සඳහා ඉදිරිපත් කළයුතු වුවද, දිස්ත්‍රික් කාර්යාල 13 ක සහ ප්‍රධාන කාර්යාලයේ සමාලෝචිත වර්ෂය සඳහා වූ සමීක්ෂණ මණ්ඩල වාර්තා 2015 ජුනි 25 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ii) දෙපාර්තමේන්තුව සතු වාහන, බුල්ඩෝසර් යන්ත්‍ර පිළිබඳ සමීක්ෂණ මණ්ඩල වාර්තාවක් සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. මේ හේතුවෙන් දෙපාර්තමේන්තුව සතු වත්කම් සියල්ල නිසියාකාරව පවතින බවට හා විසර්ජන ගිණුමේ සඳහන් කර ඇති පාඩු පිළිබඳ ප්‍රකාශය හා ජංගම නොවන වත්කම් සංචලනය පිළිබඳ වාර්තාවේ නිවැරදිතාවය තහවුරු කර ගැනිමට නොහැකි වී තිබුණි.

(iii) 2004 ඔක්තෝබර් 14 දිනැති අංක 174 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව වත්කම්වලට අදාල සංකේතාංක දක්වා නොතිබුණි.

(iv) ප්‍රවාහන අංශයෙන් ඉදිරිපත් කර තිබු වාර්තාවලට අනුව දෙපාර්තමේන්තුව සතුව වාහන 133 ක් තිබුණ ද ඒ පිළිබඳ විස්තරාත්මක ලේඛනයක් නඩත්තු කර නොතිබුණි.

(v) දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර තිබුණු අපහරණයට යෝජිත ගර්භිත ට්‍රැක්ටර් හා කෘෂි උපාංග ලැයිස්තුවට අනුව රෝද 04 ට්‍රැක්ටර් 183ක් ද, ට්‍රේලර් 92 ක්ද, රෝද දෙකේ ට්‍රැක්ටර් 85 ක් ද අනිකුත් කෘෂි උපකරණ 254 ක්ද ,යතුරු පැදියක් ද, ලොරියක් සහ කැබ් රථයක් ද ඇතුළත්ව තිබූ අතර, අපහරණ කටයුතු 2015 ජූනි 15 දින වන විටත් අවසන් කර නොතිබුණි.

**(ඇ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

**---------------------------------------**

සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 8 ක් වටිනා එක් මෝටර් රථයක් අවිධිමත් ලෙස වෙනත් ආයතනයක් වෙත මුදා හැර තිබුණු බව නිරීක්ෂණය විය.

## 5.7 අනුකූල නොවීම්

**-----------------**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

**--------------------------------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(අ) ව්‍යවස්ථාපිත විධිවිධාන** | | |
| **2000 අගෝස්තු 18 දිනැති අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත** | | |
| (i) 32 හා 33 වගන්තිය | - | අනවසර කුඹුරු ගොඩකිරීම් පැමිණිලි ප්‍රමාණය 391 ක් වූ අතර නඩු පැවරීම් සමථයකට පත්කර තිබූ පැමිණිලි සංඛ්‍යාව 64 ක් විය. |
| (ii) 43 වගන්තිය | - | සියළුම ගොවි සංවිධාන ලියාපදිංචි කළ යුතු වුවත්, ගොවි සංවිධාන 1,846 ක ලියාපදිංචිය සිදුකර නොතිබුණි. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) මුදල් රෙගුලාසි 342(1) | - | පොදු කුවිතාන්සි පොත් සුරක්ෂිතව තැන්පත් කරනු වෙනුවට අනාරක්ෂිතව ගොඩගසා තිබුණු අවස්ථා ගොවිජන සේවා මධ්‍යස්ථාන නියැදි විගණන පරික්ෂාවලදි නිරීක්ෂණය විය. |
| (ii) මුදල් රෙගුලාසි 396 | 3,158,444 | දිස්ත්‍රික් කාර්යාල බැංකු ගිණුම් 14 ක හා ප්‍රධාන කාර්යාල බැංකු ගිණුමෙහි 2014 දෙසැම්බර් 31 දිනට නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකළ කල් ඉකුත් වූ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| **(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | |
| 1990 ඔක්තෝම්බර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛයේ 2.11 ඡේදය | - | වාහනවල ඉන්ධන දහනය සෑම මාස 6 කට වරක්ම පරික්ෂා කළ යුතු වුවත්, එසේ සිදු කර නොතිබුණි. |
| (ඈ) **රාජ්‍ය මුදල් චක්‍රලේඛ** | | |
| (i) 2011 සැප්තැම්බර් 27 දිනැති අංක 452 දරන චක්‍රලේඛයේ | | |

| | |
|---|---|
| - 3.1 උප ඡේදය | දෙපාර්තමේන්තු ප්‍රධානියා සහ ප්‍රාදේශිය ලේකම්වරයා විසින් නම් කරනු ලබන නියෝජිතයින් දෙදෙනෙකුගෙන් සමන්විත ත්‍රි පුද්ගල කමිටුවක් මගින් සුදුසු ගොවි සංවිධාන වෙත කොන්ත්‍රාත්තු පැවරිය යුතු වුවද, ගම්පහ හා කළුතර දිස්ත්‍රික් කාර්යාල විසින් ඊට පටහැනිව කටයුතු කර තිබුණි. |
| - 3.2 උප ඡේදය | ගොවි සංවිධාන වෙත කොන්ත්‍රාත් පිරිනැමීමේදී අනුමත ගොවි සංවිධානවල මූල්‍ය තත්ත්වය, මූල්‍ය පහසුකම් සපයා ගැනිම පිළිබදව සනාථ කර ගැනිමකින් තොරව හා පෙර කරන ලද කොන්ත්‍රාත් පිළිබද විස්තර නොමැතිව කොන්ත්‍රාත් පිරිනමා තිබූ බව කළුතර හා ගම්පහ දිස්ත්‍රික් කාර්යාල නියැදි පරික්ෂාවේදි නිරීක්ෂණය විය. |
| -3.5 උප ඡේදය | ගොවි සංවිධාන මගින් සිදුකරනු ලබන ඉදිකිරිම් මනා ප්‍රමිතියකින් යුතුව සිදුකරන ලබන බවටත්, අදාල තාක්ෂණ අධික්ෂණයක් සිදු කිරිමටත් අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. |
| (ii) 2009 නොවැම්බර් 13 දිනැති අංක 438 දරන චක්‍රලේඛය | රාජ්‍ය ආයතනවල ප්‍රයෝජනයට ගත නොහැකි වත්කම් අපහරණය කිරිමට කටයුතු කළ යුතු වුව ද, ගර්හිත තත්ත්වයේ පැවති වාහන, කෘෂි උපකරණ, යන්ත්‍ර හා ට්‍රැක්ටර් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. |
| (ඉ) 2012 පෙබරවාරි 29 දිනැති අංක 04/2012 දරන (ගොවි බැංකු) ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්වරයාගේ චක්‍රලේඛයේ 4.4.2 ඡේදය | ගොවිජන බැංකුවට ලබාදි තිබුණ ප්‍රාග්ධන මුදල් වර්ෂ 5 ක් තුළ ආපසු ගෙවිය යුතු වුවත් 2014 දෙසැම්බර් 31 දිනට ආපසු නොගෙවූ හිඟ ප්‍රාග්ධන මුදල රු.134,580,855 ක් විය. |

## 5.8 කාර්යසාධනය

2014 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරි සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්**

**-----------------------------------------------------------**

දිවයින පුරා පවතින වී වගා නොකළ එහෙත් වගාව සඳහා යෝග්‍යා මට්ටමේ පවතින පුරන් වී ඇති කුඹුරු ඉඩම් සංවර්ධනය කිරිම අරමුණු කරගෙන ක්‍රියාත්මක කරනු ලබන සුළු වාරිමාර්ග හා පුරන්කුඹුරු අස්වැද්දීමේ වැඩසටහන යටතේ සමාලෝචිත වර්ෂය තුළ දිස්ත්‍රික්ක 02 ක වැඩ ආරම්භ නොවූ ව්‍යාපෘති 12 ක් හා වැඩ අවසන් නොකළ ව්‍යාපෘති 313 ක්ද ඇතුළත් අවසන් නොකළ ව්‍යාපෘති පැවති බව නිරික්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| දිස්ත්‍රික්කය | වැඩ ආරම්භ නොවූ ව්‍යාපෘති | වැඩ අවසන් නොකළ ව්‍යාපෘති |
|---|---|---|
| මාතර | 11 | 53 |
| කැගල්ල | - | 03 |
| පුත්තලම | 01 | 54 |
| ගාල්ල | - | 17 |
| කුරුණෑගල | - | 147 |
| බදුල්ල | - | 39 |

(ආ) දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් කාර්යයන් සමාලෝචිත වර්ෂයේදී ඉටු කර නොතිබුණි.

(i) ගොවිජන සංවර්ධන පනතේ 29 වන වගන්තිය ප්‍රකාරව කුඹුරු හඳුනා ගැනිම හා වී වගා කළ නොහැකි ඉඩම් ලෙස හඳුනා ගනු ලබන කුඹුරු ඉඩම්වල වෙනත් භෝග වගා කරවිම සඳහා වැඩ පිළිවෙලක් සකස්කර ක්‍රියාත්මක කර නොතිබුණි.

(ii) කුඹුරු ඉඩම් හඳුනා ගැනිමට වැඩ පිළිවෙලක් සකස්කර ක්‍රියාත්මක කර නොතිබුණ අතර හඳුනාගත් කුඹුරු ඉඩම් සඳහා වඩාත් සුදුසු භෝග වර්ග වගා කරවිමට කටයුතු කර නොතිබුණි.

**(ඇ) සැලැසුම් කිරීම**

**------------------**

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම අනුව කටයුතු කර නොතිබුණු අවස්ථා නිරික්ෂණ විය.

(i) ක්‍රියාකාරි සැලැස්මට අනුව 2014 පෙබරවාරි 28 දිනට පෙර දිස්ත්‍රික්කවල පවතින රෝද 02 හා රෝද 04 ට්‍රැක්ටර් පිළිබඳ සංගණනයක් සිදුකිරිමට සැලැසුම් කර තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් සංගණනයක් සිදුකර නොතිබුණි.

(ii) ක්‍රියාකාරි සැලැස්මට අනුව කාර්තුවකට ගොවිජන සේවා මධ්‍යස්ථාන 250 ක් අධික්ෂණය කර වර්ෂයකට වාර්තා 1,000 ක් ලබා ගැනිමට සැලැසුම් කර තිබුණ ද සමාලෝචිත වර්ෂයේදී වාර්තා 393 ක් පමණක් ලබා ගෙන තිබුණි.

(iii) ක්‍රියාකාරි සැලැස්මට අනුව වාර්ෂික අක්කර බදු ඉලක්කය රු. 23,465,186 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේදී එකතු කරගත් අක්කර බදු ආදායම රු.16,316,322 ක් වී තිබුණි.

(iv) එළදා අලෙවි අංශයේ ප්‍රගති වාර්තා පිළියෙල කර නොතිබු බැවින් ක්‍රියාකාරි සැලැස්මට අනුව සැලැසුම් කළ කාර්යයන් ඉටු කර තිබේද යන්න විගණනයට තහවුරු කර ගැනිමට නොහැකි විය.

**5.9 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීමේ දීර්ඝ ප්‍රමාදයන්**

හම්බන්තොට ගොවිජන සේවා දිස්ත්‍රික් කාර්යාලයේ සමාලෝචිත වර්ෂයේ බැංකු සැසඳුම් පිළියෙල කර නොතිබුණි.

**(ආ) ගැලපුම් කළයුතු ශේෂ**

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2014 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශවල දැක්වුණු ගැලපුම් පිළිබඳ විග්‍රහයට අනුව අනාවරණය වූ තොරතුරු පහත දැක්වේ.

| **ගැලපුම් පිළිබඳ විස්තරය** | **කාල විශ්ලේෂණය** | | | **එකතුව** |
|---|---|---|---|---|
| | **මාස 06 ට වැඩි වර්ෂ 01 ට අඩු** | **වර්ෂ 01 ට වැඩි 03 ට අඩු** | **වර්ෂ 03 ට වැඩි** | |
| | රු. | රු. | රු. | රු. |
| (i) උපලබ්ධි නොවූ තැන්පතු | 420,689 | 900 | - | 421,589 |
| (ii) නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත් | 3,116,891 | 37,293 | 4,260 | 3,158,444 |
| (iii) හඳුනා නොගත් හර | 6,447 | - | 63,776 | 70,223 |
| (iv) හඳුනා නොගත් බැර | 208,940 | 10.000 | -- | 218,940 |

**5.10 අනාර්ථික ගනුදෙනු**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(අ) මහජන චීන සමුහාණ්ඩුව විසින් සමාලෝචිත වර්ෂයේදි ප්‍රදානය කර තිබුණු රු. මිලියන 208 ක් වටිනා ට්‍රැක්ටර් හා කෘෂි යන්ත්‍රෝපකරණ 280 ක ප්‍රමාණයක් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් දෙපාර්තමේන්තුව වෙත ලබාදි තිබු අතර දෙපාර්තමේන්තුව ඒ සඳහා රු.මිලියන 6.1 ක් වැය කර තිබු බව නිරික්ෂණය විය. එම යන්ත්‍රෝපකරණ විසර්ජන ගිණුමේ ජංගම නොවන වත්කම් සංචලන වාර්තාවට ඇතුළත් කර නොතිබුණු අතර 2015 ජුනි 12 දින වන විටත් කෘෂි යන්ත්‍රෝපකරණ 210 ක ප්‍රමාණයක් බෙදාහැර නොතිබුණි.

(ආ) කුඹුරු ඉඩම් සඳහා දත්ත පාදමක් සැකසීමේ නියමු ව්‍යාපෘතිය සඳහා ගම්පහ දිස්ත්‍රික්කය තෝරා ගෙන තිබුණි.ඒ සඳහා චන්ද්‍රිකා ඡයාරූප පෞද්ගලික ආයතනයකින් රු.3,267,840 ක් වැය කර සමාලෝචිත වර්ෂයේදි මිලදී ගෙන තිබුණි. එම ඡායාරූප පදනම් කරගෙන ගොවිජන සේවා මධ්‍යස්ථාන සඳහා දත්ත සලකුණු කිරීමේ සිතියම් 1,110 ක් බෙදා දී තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී එකතු කරගෙන තිබුණු සිතියම් ප්‍රමාණය 67 ක් වී තිබුණි. පරිගණක ගත කළ සිතියම් ප්‍රමාණය 20 ක් වී තිබුණි.

## 5.11 විසඳා නොතිබුණු විගණන ඡේද

දෙපාර්තමේන්තුවට අදාලව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| **වර්ෂය** | **ඡේද අංකය** | |
| 2012 | 2.6(ආ) | ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වා නොතිබුණි. |

## 5.12 කළමනාකරණ දුර්වලතා

සමාලෝචිත වර්ෂයේදී මූලික විමර්ෂණ 170 ක්ද මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව පරික්ෂණ 15 ක් ද පවත්වා තිබූ අතර , විධිමත් විනය පරික්ෂණ ආරම්භ කර ඇති සංඛ්‍යාව 64 ක් වූ අතර විධිමත් විනය පරික්ෂණ අවසන් කර විනය නියෝග නිකුත්කර ඇති ප්‍රමාණය 32 ක් පමණක් විය.

## 5.13 මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 107 | 79 | 28 |
| (ii) | තෘතියික මට්ටම | 644 | 466 | 178 |
| (iii) | ද්විතියික මට්ටම | 14,371 | 11,734 | 2,637 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 425 | 289 | 136 |
| | එකතුව | 15,547 | 12,568 | 2,979 |

(ආ) **වෙනත් පාර්ශවයන්ට නිදහස් කළ මානව සම්පත්**

දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේදී කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් 04 දෙනෙක්ද ගොවිජන සංවර්ධන නිලධාරියෙකුද වෙනත් අමාත්‍යාංශවලට මුදාහැර තිබුණු බව නිරීක්ෂණය විය.

## 6. ශීර්ෂ 305 - උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව

### 6.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| (i) | දෙපාර්තමේන්තු විසර්ජන (සම්මත වැය) ලෙජරය | මුදල් රෙගුලාසි 447 | යාවත්කාලීන කර නොතිබුණි. |
| (ii) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ලේඛනයක් පවත්වා නොතිබුණි. |

### 6.2 විසර්ජන ගිණුම

**තවදුරටත් අයකර ගැනීමට හෝ කපාහැරීමට හෝ අත්හැරීමට හෝ ඇති පාඩු**

2013 වර්ෂයේ විසර්ජන ගිණුමේ තවදුරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත් හැරීමට ඇති පාඩු යටතේ දක්වා තිබුණු වසර 05 සිට වසර 10 දක්වා වූ කාල පරාසයට අයත් සිද්ධි 02 කට අදාල රු.583,946 ක අලාභය සමාලෝචිත වර්ෂයේ ගිණුම්වලින් අතහැරී තිබුණි.

### 6.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය අනුව වැඩ තහනම් කර තිබුණු නිලධාරියෙකුගෙන් වසර 02 කට අධික කාලයක සිට පැවැත එන රු.137,120 ක ශේෂය හා සේවය අතහැර ගිය නිලධාරියෙකුගෙන් වසර 01 කට අඩු කාලයක සිට පැවැත එන රු.180,197 ක හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.